# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අති විශෙෂ**

**අංක 2312/03 – 2022 දෙසැම්බර් 26 වැනි සඳුදා – 2022.12.26**

**(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)**


# I වැනි කොටස: (I) වැනි ඡෙදය – සාමාන්‍ය

## රජයේ නිවේදන

මගේ අංකය: IR/COM/05/2016/145.

**කාර්මික ආරාවුල් පනත - 131 වන අධිකාරය**

131 වන අධිකාරය වන සංශෝධිත කාර්මික ආරාවුල් පනතේ 4(1) වගන්තිය යටතේ 2019.04.03 දිනැති හා අංක 2117/34 දරන *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශෙෂ ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධ කරන ලද 2019.03.26 දින දරන නියෝගයෙන්, එක් පාර්ශ්වයක් වශයෙන් හාලි ඇල, උඩුවර, 5 වන කණුව, ''ශ්‍රී කාන්ති'' හි පදිංචි ජී. ඩබ්. නන්දසිරි මහතා සහ කොළඹ 05, කිරුළ පාර, අංක 200 හි පිහිටි ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය අතර පවත්නා කාර්මික ආරාවුල බේරුම් කිරීමෙන් සමථයකට පත්කිරීම සඳහා යොමු කරන ලදුව, බේරුම්කරු විසින් මා වෙත එවා ඇති 2022.11.18 දිනැති ප්‍රදානය එම පනතේ 18(1) වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

**බී. කේ. ප්‍රභාත් චන්ද්‍රකීර්ති,**
කම්කරු කොමසාරිස් ජනරාල්.

2022 දෙසැම්බර් මස 08 වැනි දින,
කම්කරු දෙපාර්තමේන්තුව,
කොළඹ 05.



*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

**බේරුම්කරණ අංශය හා කාර්මික අධිකරණයේ දී ය**

ජී. ඩබ්. නන්දසිරි මහතා,
''ශ්‍රී කාන්ති'',
5 වන කණුව,
උඩුවර,
හාලිඇල.

*(පළමු පාර්ශ්වය)*

නඩු අංකය: A/41/2019
IR/COM/05/2016/145

එදිරිව

ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය,
අංක 200, කිරුළ පාර,
කොළඹ 05.

*(දෙවන පාර්ශ්වය)*

අතර පවතින කාර්මික ආරාවුල

**ප්‍රදානය**

කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍ය රවීන්ද්‍ර සමරවීර මැතිතුමා විසින් 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමඟ කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරවුල් පනතේ 4(1) වන වගන්තියෙන් ඔහු වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරවුල බේරුම් කිරීමෙන් සමථයකට පත් කිරීම සඳහා 2019.03.26 වන දින බේරුම්කරු වශයෙන් මා පත්කර ඇත.

එකී යොමු කිරීම අනුව ''2019.03.09 වන දින කම්කරු කොමසාරිස් ජනරාල්තුමාගේ යොමුව පරිදි ඉහත සඳහන් පාර්ශ්වකරුවන් අතර ඇති කාර්මික ආරවුලට හේතු වූ කරුණ වූයේ 2013.01.15 දිනැති රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ අංක 01/2013 අනුව 2013.01.01 වන දින සිට රාජ්‍ය ව්‍යවසායන්හි සේවකයින් විශ්‍රාම ගැන්වීමේ වයස අවුරුදු 60 දක්වා දීර්ඝ කර තිබියදී ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ කොන්දොස්තරවරයෙකු ලෙස සේවය කළ ජී. ඩබ්. නන්දසිරි මහතාව වයස අවුරුදු 57 මාස 6 ක් තිබියදී අනිවාර්ය විශ්‍රාම ගැන්වීමත් නැවත 2015.05.07 වන දින වැටුප් රහිතව සේවයේ පිහිටුවීම මගින් ඒ මහතාට අසාධාරණයක් සිදුව තිබේද? යන්න හා එසේ අසාධාරණයක් සිදුව තිබේනම් ඔහුට හිමිවිය යුතු සහන කවරේද යන්නත් පිළිබඳව වේ.''

පළමු පාර්ශ්වය සහ දෙවන පාර්ශ්වය පළමු ප්‍රකාශ ඉදිරිපත් කළ පසු එකී ප්‍රකාශයන් සඳහා ප්‍රතිවිරුද්ධ දෙවන ප්‍රකාශ ඉදිරිපත් කළ පසු 2019.09.26 වන දින විභාගයට කැඳවන ලදී. ඒ අවස්ථාවේදී සමථයක් තිබේදැයි විමසා සිටියත් එසේ සමථයක් නොමැති බව ප්‍රකාශ කර සිටි බැවින් 2019.10.07 වන දිනට විභාගය නියම කරන ලදී.

විභාගය ආරම්භයේදී වගඋත්තරකාර දෙවන පාර්ශ්වය විසින් මූලික විරෝධතාවයක් ඉදිරිපත් කරන ලදී. එම විරෝධතාවය වූයේ විශ්‍රාම ගිය අයෙකුට ඇමතිවරයා පත්කළ බේරුම්කරුවෙකුට සේවකයෙක් පිළිබඳව (ඉල්ලුම්කරු) නියෝගයක් ලබා දීමට බලතල නොමැති බවයි. ඉල්ලුම්කාර පාර්ශ්වය ඒ අවස්ථාවේදී කියා සිටියේ ඉල්ලුම්කරු 2016.11.12 වන දින විශ්‍රාම යාමට පෙර එනම් 2016.06.08 වන දින ඔහුට සිදු වූ අසාධාරණය සම්බන්ධව බදුල්ල දිස්ත්‍රික් කම්කරු කාර්යාලයට පැමිණිල්ලක් කළ අවස්ථාවේදී දෙවන පාර්ශ්වයේද නියෝජනයක් තිබූ බවත් එම අවස්ථාවේදී විසඳුමක් නොලැබුණු බැවින් කොළඹ කම්කරු කාර්යාලයේ කාර්මික සම්බන්ධතා අංශයට යොමුකර ඇති බවත් එහිදී දෙවන පාර්ශ්වය නිර්දේශයට එකඟ නොවූ බැවින් මෙම අධිකරණයට මෙම නඩුව යොමුකළ බවයි.

මෙහිදී දෙවන පාර්ශ්වය ලිඛිත විරෝධතා ඉදිරිපත් කිරීමට දින පැතූ බැවින් 2022.10.23 වන දින ලිඛිත විරෝධතා සලකා බලා අවසානයේ නිගමනයකට පැමිණ ප්‍රදානයට කටයුතු කරන බව දන්වා විභාගය ආරම්භ කරන ලදී.

පළමුවෙන් ඉල්ලුම්කරු කොන්ත්‍රාත් පදනම මත 1994.03.01 වන දින සිටත් 1995.01.08 වන දින අනියම් පදනම මත පත්කර 2003.08.01 වන දින ස්ථිර පත් කිරීමක් ලැබ, 2014.05.07 වන දින සිට අනිවාර්ය විශ්‍රාම ගැන්වූ බව සාක්ෂි දෙමින් කියා සිටී. විශ්‍රාම පූර්ව දැනුම් දීමක් නැතිව 2014.05.06 වන දින මොණරාගල ඩිපෝ කළමනාකරුගේ ලිපියෙන් 2014.05.07 වන දින සේවා නිමාවෙන් පසු විශ්‍රාම ගන්වා ඇත. විශ්‍රාම ගැන්වීමෙන් පසු 2015.05.14 දිනැති ලිපියෙන් 2014.05.07 වන දින සිට නැවත සේවයේ ප්‍රතිෂ්ඨාපනය කර ඇත.

එසේ විශ්‍රාම ගන්වා සිටි නමුත් සේවයට කැඳෙව්වේ කෙසේදැයි අසන ලද ප්‍රශ්නයට පිළිතුරු දෙමින් මොණරාගල ඩිපෝවේ කළමනාකාර මහතා දුරකථනයෙන් කැඳවූ බවට ප්‍රකාශ කරන ලදී. සේවයේ යළි ප්‍රතිෂ්ඨාපනය කිරීමේදී විශ්‍රාම ගැන්වූ දින සිට හිඟ වැටුප් රහිතව විශ්‍රාම ගැන්වූ අවුරුද්දයි මාස 6 කට පසුව සේවයේ ප්‍රතිෂ්ඨාපනය කරන බව දන්වා දුන් ලිපියට අත්සන් තබා ඇත. එසේ අත්සන් කිරීම කරන ලද්දේ උසස් පෙළ විභාගයට ලියන දරුවන් දෙදෙනෙක් සිටින බවත් ඒ වන විට ත්‍රිරෝද රථයක ඔහුව හප්පා අනතුරට ලක්වී ඉල ඇට දෙකක් බිඳීම නිසා සහ වකුගඩු රෝගයෙන් ශල්‍යකර්මයක් කර සිටි නිසා අසරණ තත්වය මත සිටි නිසා බවයි.

01/2013 දරන චක්‍රලේඛය 2013.01.15 වන දින නිකුත් කර තිබූ බවත් එම චක්‍රලේඛය 2013.01.01 වන දින සිට ක්‍රියාත්මක විය යුතු බවත් එම චක්‍රලේඛය අනුව අවුරුදු 60 දක්වා සේවය කිරීමට හිමිකම් ඇති බවත් එම චක්‍රලේඛය අනුව අවුරුදු 60 දක්වා සේවය කිරීමට ඉල්ලීම් කිරීමට අවශ්‍ය නැති බවත් එම 01/2013 චක්‍රලේඛය අනුව වයස අවුරුදු 57 යි මාස 6න් විශ්‍රාම ගැන්වීමට බලයක් නැති බවත් ඉල්ලුම්කරුට සිදු වූ අසාධාරණයට එරෙහිව බදුල්ල සහකාර කම්කරු කොමසාරිස්තුමා වෙත 2016.03.01 වන දින පැමිණිලි කළ බවත් එයින් සහනයක් නොමැති බැවින් කොළඹ නාරාහේන්පිට කම්කරු කාර්යාලයට තම ප්‍රශ්නය යොමුකළ බවත් එම නිසා 2014.05.07 වන දින සිට 2015.05.14 දින දක්වා කාලයට හිඟ වැටුප් සහ රු. 50,000.00 ක් ගමන් වියදම් ලෙසත් රු. 50,000.00 ක වන්දි මුදලක් ද ඉල්ලා සිටින බවයි.

දෙවන පාර්ශ්වය විසින් හරස් ප්‍රශ්න ඇසීම ආරම්භ කරනු ලැබූ අවස්ථාවේදී ඉල්ලුම්කරු කියා සිටියේ දුරකථනය මගින් ඩිපෝ කළමනාකරු සේවයට කැඳවූ බවයි. සේවය කරමින් සිටියදී කම්කරු විනිශ්චය සභාව බදුල්ල කාර්යාලයට පැමිණිලි කර ඇත. එය A 5 ලෙස ලකුණු කරන ලදී. එය සත්‍ය පිටපතක් බව කාර්මික සම්බන්ධතා අංශයේ සහකාර කම්කරු කොමසාරිස් සහතික කළ පිටපතක් ඉදිරිපත් කර ඇත.

R 5 සහ R 6 ලේඛන පෙන්වා දෙමින් (1996.07.22, 1996.10.01 දිනැති) ඔහුට නඟන ලද චෝදනා හා විභාගගත කරන ලද අවස්ථා ප්‍රශ්න කළත් විසඳීමට සිදුව ඇත්තේ 2015.05.07 වන දින වැටුප් රහිත සේවයේ පිහිටූ විට අසාධාරණයක් සිදුවී තිබේද යන්නයි. 2015.05.07 වන දිනට පෙර වැරදි සලකා බැලිය යුතුව තිබුණේ ඔහු නැවත සේවයේ පිහිටුවීමට පෙරය. ඔහු 2015.05.07 වන දින විශ්‍රාම ගැන්වීම මාස 06 කට පෙර දැන්විය යුතු වුවත් ඒ පිළිබඳව ඔහුට දන්වා ඇත්තේ 2014.05.06 වන දිනදීය. 2014.05.05 වන දින මොණරාගල ඩිපෝවෙන් සේවයට වාර්තා කළ සේවකයා බදුල්ලටත් නැවත අම්පාරටත් අම්පාරේ සිට නැවත මොණරාගලට පැමිණ සේවය අවසන් කර (එනම් මුදල් බැඳීමෙන් පසු) ඊට පසුව සේවය අවසන් කිරීමේ ලිපිය දුන් බවත් එක් දිනක් හෝ කල් නොදුන් බව වෙනත් සාක්ෂිකරුවන්ගේ සාක්ෂිවලින් ද හෙළිදරව් වෙයි.

වයි.එම්. උපසේන නමැති අයව ඉල්ලුම්කරු වෙනුවෙන් සාක්ෂියට කැඳවන ලදී. 1980 සිට අවුරුදු 36ක සේවා කාලයෙන් පසු 2011.04.01 වන දින විශ්‍රාම ගන්වා ඇත. නැවත කොන්ත්‍රාත් පදනම මත නාරාහේන්පිට ප්‍රධාන කාර්යාලයේ උපාධිධාරී ජ්‍යෙෂ්ඨ විභාග නිලධාරියෙකු ලෙස සේවය කර ඇත. ඔහුගේ සාක්ෂිය මගින් හෙළිදරව් වන්නේ අංක 60 දරන චක්‍රලේඛය අවලංගු කර 2014.12.18 දිනැති උපායමාර්ග කළමනාකරණ භාණ්ඩාගාර චක්‍රලේඛය අනුව රාජ්‍ය බැංකු සඳහා පමණක් එම 01/2013 චක්‍රලේඛය අදාළ නොවන බවයි.

ඒ අනුව ලංකා ගමනාගමන මණ්ඩලය හෝ වෙනත් රාජ්‍ය ව්‍යාපාර ආයතනවල අධ්‍යක්ෂ මණ්ඩලවලට 01/2013 චක්‍රලේඛය වෙනස්කර ක්‍රියාත්මක කළ නොහැකි බවයි. ඔහු සාක්ෂි දෙමින් සේවකයෙක් සේවයේ ප්‍රතිෂ්ඨාපනය කරනවා යනු සේවය කඩවීමක් හෝ සේවය නැවැත්වීමක් සිදුකර ඇති කාලයට ඔහුගේ වැටුප් හා දීමනා ලබාගත හැකි බවයි. එසේ වැටුප් ලබාගත් සේවකයෙකු වන ඩී.ඩබ්. විමලසේන නඩු අංකය LTS/20402/2017 යටතේද, අබේසිංහ මුදියන්සේලාගේ තිලකරත්න නඩු අංකය LT/20405/2014 යටතේ සහ LTS/20408/2014 යන නඩුව මගින් බදුල්ල කම්කරු විනිශ්චය සභාව මගින් දෙන තීරණය අනුව හිඟ වැටුප් ලබාගත හැකි බව තීන්දු කර ඇත.

ඉල්ලුම්කාර නන්දසිරි මහතා විශ්‍රාම යවා ඇත්තේ රජයේ නීත්‍යානුකූල චක්‍රලේඛයට පටහැනිව වේ. එසේම ඔහුව සේවයට කැඳවා ඇත්තේ ඩිපෝ කළමනාකරු බවත් සේවකයාගේ ඉල්ලීම මත නොවන බවත් සනාථ වෙයි. සාක්ෂිකරුගෙන් 2015/01 දරන චක්‍රලේඛය අනුව නේද විශ්‍රාම යවා ඇත්තේ කියා හරස් ප්‍රශ්න ඇසූ විට දෙනු ලබන පිළිතුර වූයේ 2015.05.14 චක්‍රලේඛය මගින් විශ්‍රාම යැවූවත් ඒ වන විට 01/2013 චක්‍රලේඛය නිකුත් වී ඇති බැවින් ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය නිකුත් කළ චක්‍රලේඛය නීති විරෝධී චක්‍රලේඛයක් බවයි.

දෙවන පාර්ශ්වය වෙනුවෙන් සාක්ෂිය සඳහා අවන්ත අමරවීර යන අයෙකු කැඳවන ලදී. වාණිජවේදී ශාස්ත්‍රපති උපාධිය හිමි අයෙකු බවත් නීතිය පිළිබඳ විශ්වවිද්‍යාලයේ අවසන් වසරේ ඉගෙනුම ලබන බවත් නියෝජ්‍ය මානව සම්පත් කළමනාකරු ලෙසත් දැනට සේවය කරන බවත් කියා සිටී. කළමනාකරණ දෙපාර්තමේන්තුව නිකුත් කළ චක්‍රලේඛය භාණ්ඩාගාරයේ රේඛීය අමාත්‍යාංශයෙන් විමසා අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතියෙන් චක්‍රලේඛයක් ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය නිකුත් කරන බව කියා සිටී.

2013/01 භාණ්ඩාගාර චක්‍රලේඛයට සමගාමීව ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය 2013/03 චක්‍රලේඛය නිකුත් කළ බව සාක්ෂි දෙමින් කියා සිටී. 2013/03 චක්‍රලේඛය මගින් 2015/01 චක්‍රලේඛය ද බලාත්මක අතර එය 2011.12.12 වන දින නිකුත් කළ චක්‍රලේඛයක් බවද කියා සිටී. එයට පදනම් කර ගත්තේ 2011.04.09 චක්‍රලේඛයයි.

විත්තිය වෙනුවෙන් සාක්ෂි දුන් අවන්ත අමරවීරගෙන් හරස් ප්‍රශ්න ඇසීමේදී 01/2013 චක්‍රලේඛයෙන් නිදහස් කර ඇත්තේ රාජ්‍ය බැංකු පමණක් බව පිළිගනී. භාණ්ඩාගාර ලේකම් විසින් නිකුත් කරන ලද චක්‍රලේඛයක් සංශෝධනය කිරීමේ බලයක් ශ්‍රී ලංකා ගමනාග මන මණ්ඩලයට ලබා දී තිබේදැයි ප්‍රශ්න කළ විට නැත කියා පිළිතුරු දී ඇත. නෛතික බලයක් නැතත් සේවකයින් 29000ක් පමණ සේවය කරන ආයතනයක් එයට විසඳුම් ලෙස ඒ ආයතන සමග සාකච්ඡා කර උපරිම ශක්තියෙන් කටයුතු කරන බව කියා සිටී. නමුත් රජය විසින් අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත 01/2013 චක්‍රලේඛය සංශෝධනය කිරීමේ බලයක් කිසියම් ආයතනයකින් ලබාගෙන නැතිබව පිළි ගනී. නඩුවේ ඉල්ලුම්කරු සිය කැමැත්තෙන් සේවයෙන් අස්වූ හෝ විශ්‍රාම ගිය අයෙකු නොවන බව පිළිගනී.

ඉහත තත්වයන් තුළ 01/2013 රාජ්‍ය භාණ්ඩාගාර චක්‍රලේඛය අනුව ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයද සේවකයන් විශ්‍රාම ගැන්විය යුතුව තිබුණත් වෙනත් චක්‍රලේඛයක් අදාළ කර ගනිමින් විශ්‍රාම යවා නැවත සේවයේ පිහිටුවීමෙන් එම ක්‍රියාවලිය නීති විරෝධී හා අසාධාරණ අයුක්තිසහගත ක්‍රියාවලියක් බැවින් එම සමස්ථ සාක්ෂි සහ ලේඛන අනුව අනිවාර්ය නිවාඩු ගන්වා නැවත සේවයේ පිහිටුවූ කාලය සඳහා එනම් 2014.05.07 වන දින සිට 2015.05.13 වන දින දක්වා වූ මාස 12 දින 6ක කාලය සඳහා මුල් වරට විශ්‍රාම ගන්වන අවස්ථාවේ ඔහු ලබමින් සිටි වැටුප මත ගණනය කර නියමිත හිඟ වැටුප් මුදල සහකාර කම්කරු කොමසාරිස් (නැගෙනහිර කොළඹ) වෙත තැන්පත් කිරීමට කටයුතු කරන ලෙස ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයට නියෝග කරමි.

පැමිණිලිකරු දුර බැහැර සිට නඩු විභාගය සඳහා පැමිණීමත් විත්තියේ යම් යම් හේතු මත නඩුවට දින යාමත් හේතුකොටගෙන ඉල්ලුම්කරුට සිදුවූ වියදම් සඳහා පැමිණිල්ලෙන් රුපියල් ලක්ෂයක් ඉල්ලා ඇතත් රු. 50,000.00 ක මුදලක් වියදම් සඳහා ලබාදෙන ලෙසත් නියෝග කරමි. මෙම සමථය තීරණය කිරීමේදී ඉල්ලුම්කරුගේ සාක්ෂි ඉදිරිපත් කරන ලද ලේඛන සහ වගඋත්තරකරු ඉදිරිපත් කළ සාක්ෂි සහ ලේඛනද සලකා තීරණයකට එළඹුණු අතර ඉල්ලුම්කරුට ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය ගෙවිය යුතු හිඟ වැටුප් හා වියදම් වශයෙන් ශ්‍රීලංගම/නීති/බේරුම්/2022 හා 2022.11.16 වන දින ඉදිරිපත් කරන ලද ලිපියට අනුව වූ මුදල වන රු. 344,688.00 ක මුදල සහකාර කම්කරු කොමසාරිස් (නැගෙනහිර කොළඹ) වෙත තැන්පත් කිරීමට නියම කරමි. එය සාධාරණ හා යුක්තිසහගත ප්‍රදානයක් බව සහතික කරමි.

ආර්. එස්. ආරියප්පෙරුම,
බේරුම්කරු.

2022.11.18 වැනි දින.

EOG 12-0316

මගේ අංකය: IR/COM/05/H/2015/30.

**කාර්මික ආරාවුල් පනත - 131 වන අධිකාරය**

131 වන අධිකාරය වන සංශෝධිත කාර්මික ආරාවුල් පනතේ 4(1) වගන්තිය යටතේ 2019.02.14 දිනැති හා අංක 2110/37 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධ කරන ලද 2019.02.07 දින දරන නියෝගයෙන්, එක් පාර්ශ්වයක් වශයෙන් බෙලිහුල්ඔය, සබරගමුව විශ්ව විද්‍යාලය, ශිෂ්‍ය සේවා අංශය, උපශාලාධිපති පී. බී. මංජුල ප්‍රසාද් මයා සහ බෙලිහුල්ඔය, තැ.පෙ. 02 හි පිහිටි ශ්‍රී ලංකා සබරගමුව විශ්ව විද්‍යාලය අතර පවත්නා කාර්මික ආරාවුල බේරුම් කිරීමෙන් සමථයකට පත්කිරීම සඳහා යොමු කරන ලදුව, බේරුම්කරු විසින් මා වෙත එවා ඇති 2022.11.29 දිනැති ප්‍රදානය එම පනතේ 18(1) වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

**බී. කේ. ප්‍රභාත් චන්ද්‍රකීර්ති,**
කම්කරු කොමසාරිස් ජනරාල්.

2022 දෙසැම්බර් මස 09 වැනි දින,
කම්කරු දෙපාර්තමේන්තුව,
කොළඹ 05.

යොමු අංකය: IR/COM/05/H/2015/30

**බේරුම්කරණ අංශය හා කාර්මික අධිකරණයේ දී ය**

*නඩු අංකය:* A/04/2019

පී. බී. මංජුල ප්‍රසාද් මයා,
උපශාලාධිපති,
ශිෂ්‍ය සේවා අංශය,
සබරගමුව විශ්වවිද්‍යාලය,
බෙලිහුල්ඔය.

*පළමු පාර්ශ්වය*

එදිරිව

ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය,
තැ. පෙ. 02,
බෙලිහුල්ඔය.

*දෙවැනි පාර්ශ්වය*

*අතර පවතින කාර්මික ආරාවුල*

කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍ය ගරු රවීන්ද්‍ර සමරවීර මැතිතුමා විසින් 1957 අංක 14 හා 1957 අංක 62 සහ 1962 අංක 4 සහ 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ, ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වගන්තියෙන් ඔහු වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරාවුල බේරුම් කිරීමෙන් නිරවුල් කිරීම සඳහා 2019.02.02 දිනැති නියෝගයෙන් බේරුම්කරුවකු වශයෙන් මා පත්කොට මා වෙත යොමු කර ඇත.

*ඉහත සඳහන් පාර්ශ්වයන් අතර පවතින කාර්මික ආරාවුලට හේතු වී පවත්නා කරුණ වනුයේ :*

බේරුම්කරණය සඳහා මා වෙත යොමුකර ඇති උක්ත නියෝගය ප්‍රකාරව ඉහත සඳහන් දෙපාර්ශ්වය අතර උද්ගත වී ඇති කාර්මික ආරාවුලට හේතු වී පවත්නා කාරණය ලෙස කම්කරු කොමසාරිස් ඒ. විමලවීර මහතා විසින් 2019 ජනවාරි මස 29 වන දිනැතිව එවා ඇති ලිපියේ දැක්වෙන්නේ,

''ශ්‍රී ලංකා සබරගමුව විශ්ව විද්‍යාලයේ උප ශාලාධිපතිවරයකු ලෙස සේවය කරනු ලබන පී. බී. මංජුල ප්‍රසාද් මහතාගේ වැඩ තහනම් කර විනය පරීක්ෂණයක් පවත්වා ලබාදුන් විනය නියෝගය යුක්ති සහගත ද, එසේ නොමැති නම් ඔහු වෙත හිමිවිය යුතු සහනයන් කවරේද? යන්න පිළිබඳව වේ.''

*පසුබිම සහ නඩු කාර්ය පරිපාටිය :*

මෙම නඩුව විභාගයට ගැනීමට පෙර මූලික පියවරක් ලෙස මුලින්ම සේවක, සේව්‍ය යන දෙපාර්ශ්වයේම ප්‍රකාශ ලබාගෙන ඇත. ඉන්පසු දෙපාර්ශ්වයෙන් ම සාක්ෂි විමසා ඇති අතර ඉන්පසු දෙපාර්ශ්වයේම ලිඛිත සැලකිරීම් ලබාගෙන ඇත. මේ අනුව එකී සියලුම පියවරයන්හි කරුණු සලකා බලා අවසාන වශයෙන් නියෝගය ලබා දී ඇත.

*සේවක සහ සේව්‍ය ප්‍රකාශයන් :*

01. සේවක පාර්ශ්වය විසින් තම පළමු ප්‍රකාශය 2019 මාර්තු මස 12 වැනි දින ගොනුකර ඇත.

එකී ප්‍රකාශය මගින් ප්‍රකාශ කර ඇත්තේ තමන් 2000.01.03 වැනි දින සේවායෝජක පාර්ශ්වය යටතේ සරප් තනතුරට පත්ව වර්තමානය වන විට පූර්ණ කාලීන නේවාසික උප පාලක තනතුරට පත්ව ඇති අතර, 2013 ජූලි මස 03 වැනි දින දරන ලිපියෙන් සේවායෝජක විසින් තම සේවය වැටුප් රහිතව තහනම් කර ඇති බවයි. එමෙන්ම ඉන්පසු මාසයකුත් දින 11කට පසුව 2013.08.14 වැනි දින කිසිදු මූලික විමර්ශනයක් නොකොට තමන්ට චෝදනා පත්‍රයක් එවා ඇති බව ද, එකී චෝදනා පත්‍රය අනුව තමන් 2013 ජූනි මස 20 වැනි දින අවසරයකින් තොරව සේවා ස්ථානයෙන් බැහැරව ගොස් ඇති බවටත් ඒ පිළිබඳව තමන්ගෙන් සහකාර ලේඛකාධිකාරි / අධ්‍යයන සහ ශිෂ්‍ය සේවා W. W. අනුර යන අය දුරකථනයෙන් විමසූ විට තමන් විසින් ඔහුට බැන තර්ජනය කිරීම යන මූලික චෝදනාව ඇතුළු තවත් අනුෂාංගික චෝදනා දෙකක් ඉදිරිපත්කර ඇති බව ද, තමන් 2013 ජූනි 20 දින නිවාඩු ලබා ඇති අතර එවැනි බැන තර්ජනය කිරීමක් සිදු නොකළ බව ද වැඩි දුරටත් ප්‍රකාශ කර ඇත. තව ද තමන් සම්බන්ධයෙන් සේව්‍ය පාර්ශ්වය විසින් විනය පරීක්ෂණයක් සිදුකර ඇතත් එය අයුක්ති සහගත සහ අසාධාරණ බවත් සේවක පාර්ශ්වය ප්‍රකාශ කර ඇත. තව ද එවැනි විනය පරීක්ෂණයක් මත 2014.02.19 දින විනය නියෝගයක් නිකුත් කරමින් තමන් එතෙක් උපයාගත් වැටුප් වර්ධක සියල්ල විලම්බනය කරමින් තමන් නේවාසිකාගාර උප පාලක තනතුරෙහි මූලික වැටුප් පියවරෙහි තබා තමන්ට බරපතල දඬුවම් පැමිණවීමෙන් තමන් අසාධාරණයට පත්ව ඇති බව ද වැඩි දුරටත් ප්‍රකාශ කර ඇත. මේ අනුව එකී විනය නියෝගය අසාධාරණ සහ අයුක්ති සහගත බැවින් 2013 ජූලි මස 03 වැනි දින සිට සියලු හිඟ වැටුප්, වැටුප් වර්ධක සහ වරප්‍රසාද සහිතව නැවත සේවයේ පිහිටුවන ලෙස ද සිය ප්‍රකාශයේ වැඩිදුරටත් ඉල්ලා ඇත.

02. වග උත්තරකාර පාර්ශ්වය විසින් සිය පළමු ප්‍රකාශය 2019.07.05 දින ඉදිරිපත්කර ඇති අතර එහිදී ඉල්ලුම්කරු 2001.01.03 දින සිට සරප් තනතුරෙහි සේවයට බඳවාගෙන ඇති බවත්, ඉන්පසු 2005.05.16 සිට ඔහු සබරගමුව විශ්වවිද්‍යාලයේ II ශ්‍රේණියේ පූර්ණකාලීන නේවාසිකාගාර උප පාලක තනතුරට පත්කර ඇති බව ද, ප්‍රකාශ කර ඇත. එකී සේවයේ සිටිය දී 2013.06.20 දින පූර්ව අවසරයක් නොමැතිව ඉල්ලුම්කරු සේවා ස්ථානයෙන් බැහැර වූ අවස්ථාවක ඔහුගේ අධීක්ෂණ නිලධාරි W. W. අනුර මහතා ඒ පිළිබඳව දුරකථනයෙන් විමසීමේ දී ඉල්ලුම්කරු අවිනීත ලෙස අමතමින් ජීවිත තර්ජන එල්ල කර ඇති බවත්, ඒ අනුව 2013.07.03 දිනැති ලිපිය මගින් ඉල්ලුම්කරුගේ වැඩ තහනම් කර දඬුවම් නියම කර ඇති බවත් කියා සිටී. එකී දඬුවම් වන්නේ සේවය අත්හිටුවීම, වැඩ තහනම් කාලය තුළ පූර්ව අවසරයකින් තොරව විශ්වවිද්‍යාල භූමිය සහ නේවාසිකාගාරයට ඇතුල්වීම තහනම් කිරීම, වැඩ තහනම් කාලය තුළ වැටුප් හෝ දීමනා කිසිවක් ලබා නොදීම යනාදිය බව ප්‍රකාශ කර සිටී. ඒ අනුව 2013.08.14 දිනැතිව චෝදනා පත්‍ර නිකුත්කර ඇති බව ද, ඒ අනුව විනය විභාගයක් පවත්වා ඉල්ලුම්කරු එයට වරදකරු වූ බැවින් දඬුවම් නියමකර ඇති බව ද කියා සිටී. කෙසේ වුව ද මේ සම්බන්ධයෙන් ඉල්ලුම්කරු කළ අභියාචනය සලකා බලා 2013.07.18 ලිපිය මගින් 2013.07.03 දින සිට ක්‍රියාත්මක වන පරිදි ඉල්ලුම්කරු නැවත සේවයේ පිහිටුවා අඩ වැටුප් ගෙවීමට ද කටයුතු කර ඇති බව වැඩි දුරටත් කියා සිටී.

*නඩු විභාගය සහ සාක්ෂි සම්පිණ්ඩනය* :

මෙම නඩුව 2019.08.15 දින කැඳවූ අතර සමථයක් පිළිබඳව දෙපාර්ශ්වය අතර සාකච්ඡා කළ අතර ඉල්ලුම්කරු කියා සිටින ලද්දේ පැමිණිල්ල තහවුරු කිරීමට සාක්ෂි නොමැතිව ඉල්ලුම්කරුට බරපතල දඬුවම් පමුණුවා ඇති හෙයින් එකී දඬුවම් ලිහිල් කරමින් සාධාරණයක් ඉටු කරන ලෙසයි. මෙහිදී වග උත්තරකාර පාර්ශ්වය ප්‍රකාශ කර ඇත්තේ ඉල්ලුම්කරුගේ සමථ යෝජනාව සලකා බලා මෙම අධිකරණයට දනුම්දෙන බවත්ය. ඒ අනුව ඉල්ලුම්කාර පාර්ශ්වය කියා සිටින්නේ සමථයක් සිදු නොවුවහොත් ඉදිරි දින මූලික සාක්ෂි විමසීමට කටයුතු කරන බවයි. 2019.11.21 දින නැවත විභාගයට කැඳවූ අතර වග උත්තරකාර පාර්ශ්වය ප්‍රකාශ කර ඇත්තේ ඉල්ලුම්කරුගේ අභියාචනය සලකා බලා දනටමත් සහනයන් ලබා දී ඇති බැවින් නැවත සමථයක් ඇතිවිය නොහැකි බවයි. ඒ අනුව ඉල්ලුම්කාර පාර්ශ්වය දිවුරුම් ප්‍රකාශයක් මගින් සිය සාක්ෂි ගොනුකිරීමට එකග විය.

*ඉල්ලුම්කරුගේ සාක්ෂි* :

ඉල්ලුම්කරු විසින් සිය සාක්ෂි 2019.12.23 දිනැති දිවුරුම් ප්‍රකාශයක් මගින් ඒ 1 සිට ඒ 5 දක්වා ලේඛන ද සමග ගොනුකර ඇත. දිවුරුම් ප්‍රකාශය මගින් ඉල්ලුම්කරු දක්වා ඇත්තේ තමන් 2000.03.01 සිට වග උත්තරකාර ආයතනයේ සරප් තනතුරට පත්ව එහි ස්ථිර වූ බවත් ඉන්පසු 2005.05.06 දින සිට උප ශාලාධිපති තනතුරට පත්වූ බවත්, ඉන්පසු අසාධූ චෝදනාවක් මත A 2 ලිපිය මගින් උපකුලපතිතුමා විසින් තම සේවය අත්හිටවූ බවයි. ඉන්පසු විශ්ව විද්‍යාල ආයතන සංග්‍රහයේ XXII පරිච්ඡේදයේ 2:2:7 යටතේ මූලික චෝදනා දෙකක් සහ ඊට ආනුෂංගික චෝදනා දෙකක් ඇතුළත්ව 2018.08.14 දරන චෝදනා පත්‍රය ලබා දී ඇති බවත් එකී චෝදනා පත්‍රය A 3 ලෙස සලකුණුකර කියා සිටී. චෝදනා පත්‍රයේ පළමු චෝදනාව ලෙස අවසර නොමැතිව සේවා ස්ථානයෙන් බැහැරවයාම ලෙස සඳහන් කළ ද එදින තමා අසනීප හේතුවෙන් සේවයට වාර්තා නොකළ බවත්, එකී චෝදනාව අසාධූ චෝදනාවක් බවත්, තව ද ඩබ්. ඩබ්. අනුර මහතාට බැන තර්ජනය කළ බවට චෝදනා කර ඇති අතර, එවැන්නක් නොකළ බවත් එය ද පළිගැනීමේ අරමුණින් කළ චෝදනාවක් බව ද කියා සිටී. එකී කරුණු අනුව තමන් 1, 2 චෝදනාවලට නිවැරදිකරු බැවින් ඊට ආනුෂංගික චෝදනාවන් වන 3, 4 චෝදනාවන්ට ද වරදකරු නොවන බව කියාසිටී. තවද A 3 චෝදනා පත්‍රය නිකුත්කර විනය පරීක්ෂණය සිදු කිරීමේ දී අනුර මහතා පමණක් සාක්ෂියට කැඳවා ඇති අතර, එකී සාක්ෂි තහවුරු කිරීමට වෙනත් සාක්ෂි ඉදිරිපත් නොකළ බව ද කියා සිටී. තව ද විනය පරීක්ෂණයෙන් පසු තමන්ට බරපතල දඬුවම් පමුණුවා ඇති අතර, එය අසාධාරණ බවත් ප්‍රකාශ කර සිටී. තව ද විනය දඬුවම් අනුව තමන් උපයාගෙන තිබූ වැටුප් වර්ධක සියල්ල අහිමි කිරීම ද යුක්ති සහගත නොවන බව ද වැඩිදුරටත් කියා සිටින අතර එසේ අහිමි කිරීම මත තමන් දැඩි ආර්ථික පරිහානියකට පත් වූ බව ද කියා සිටී. මූල්‍යමය වංචාවක් සිදු නොකළ අවස්ථාවක වැඩ තහනම් කළ කාලයට හිඟ වැටුප් නොගෙවීම ආයතන සංග්‍රහයේ 4:1:2 විනය පාලන පිළිවෙත්වලට අනුකූල නොවන බව ද ප්‍රකාශ කර ඇත. එමෙන්ම W. W. අනුර මහතාට බැන වැදුන බවට සෘජු සාක්ෂි හෝ දුරකථනයෙන් බැන වැදුන බවට, දුරකථන ඇමතුම් වාර්තා වැනි සාක්ෂි හෝ ඉදිරිපත් කර නොමැති බව ද ප්‍රකාශ කර ඇත. තව ද එලෙස බැන වැදුන බව පොලිස් සාක්ෂි මත තහවුරු කර නොමැති බව ද ප්‍රකාශ කර ඇත.

මේ අනුව වරද සිදුකළ බවට ඔප්පු කළ හැකි සාක්ෂි ඉදිරිපත් නොකර තමන්ට දැඩි දඬුවම් පැමිණවීමෙන් තමන්ගේ වසර 13ක සේවා කාලයට දැඩි අගතියක් සිදුකර ඇති අතර විශ්‍රාම වැටුපට සහ සේවා පාරිතෝෂිකය ලබා ගැනීමට අගතියක් සිදුව ඇති බව ද කියා සිටී. තව ද ලබාගත් වැටුප්වර්ධක සහ ඉදිරියට ලැබීමට තිබූ වැටුප් වර්ධක ද තහනම් කරමින් තම ජීවිත කාලයටම අගතියක කර ඇති බව ද කියා සිටී.

තව ද තම පූර්ව සේවා කාලය ද අසතුටුදායක බවට අධිකරණයට කරුණු දක්වුව ද, තමාගේ අඛණ්ඩ සතුටුදායක සේවා කාලය සඳහා 2016.02.21 සැමරුම් උළෙලේ දී ලෝකඩ පදක්කමක් පවා ලබා ඇති බව කියා සිටී. මේ අනුව තමන්ට අසාධාරණ ලෙස ලබා දී ඇති විනය දඬුවම් ඉවත්කර විලම්භනය කර ඇති වැටුප් වර්ධක නැවත ලබා දී හිඟ වැටුප් ලබා දෙන ලෙසත් 2014.02.19 සිට ක්‍රියාත්මක වන පරිදි නේවාසික උපපාලක තනතුරට හිමි වර්තමාන වැටුප් පරිමාණයේ පිහිටුවන ලෙසත්, සියලුම හිඟ වැටුප් සහ අදාළ ව්‍යවස්ථාපිත දීමනාවන් ලබාදෙන ලෙසත් ඉල්ලා සිටී.

මෙම නඩුව 2020.01.07 දින ඉල්ලුම්කරුගෙන් හරස් ප්‍රශ්න විමසීම සඳහා කැඳවා ඇත. කෙසේ වුව ද වග උත්තරකාර පාර්ශ්වය ප්‍රකාශ කර ඇත්තේ තමන්ට ඉල්ලුම්කරුගේ දිවුරුම් ප්‍රකාශය ලැබී ඇත්තේ 2020.01.01 දින වන බැවින් හරස් ප්‍රශ්න සඳහා සූදානම්වීමට කාලයක් නොමැති බැවින් ඒ සඳහා තවදුරටත් දිනයක් ලබාදෙන ලෙසයි. 2020.08.20 දින මෙම නඩුව නැවත කැඳවූ අවස්ථාවේ දී ඉල්ලුම්කරු විසින් දිවුරුම් ප්‍රකාශයක් මගින් ලබා දී ඇති සාක්ෂි සම්බන්ධයෙන් හරස් ප්‍රශ්න විමසීම ආරම්භ කරන ලදී.

ඉල්ලුම්කරුගෙන් හරස් ප්‍රශ්න විමසීමේ දී ඔහු ඒ වන විට වගඋත්තරකාර ආයතනයේ වසර 20ක් සහ මාස 07ක පමණ කාලයක් සේවය කරමින් සිටින බව ප්‍රකාශ කර ඇති අතර හරස් ප්‍රශ්න විමසීමේ දී ඔහුගේ දිවුරුම් ප්‍රකාශය R 1 ලෙස සලකුණු

කර සාක්ෂි දී ඇත. ඉල්ලුම්කරු සිය පත්වීමේ ලිපිය R 2 වශයෙන් සලකුණු කර ප්‍රකාශ කර ඇත්තේ තමන් 2005.05.06 දින සිට පූර්ණකාලීන නේවාසිකාගාර උප පාලක II ශ්‍රේණියේ පත්වීම් ලැබූ බවත් ය.

තව ද හරස් ප්‍රශ්න විමසීමේ දී ඉල්ලුම්කරුගේ පත්වීම් ලිපියේ දිනය R2a, තනතුර R2b, 19 කොන්දේසිය R2c, වැටුප් පියවර R2(d) අත්සන R2(e) වශයෙන් ද සලකුණු කර ඇත. ඉල්ලුම්කරුට R 3 ලේඛනය පෙන්වා එහි ඉල්ලුම්කරුගේ පැමිණීම අසතුටුදායක බවට සඳහන්ව ඇති බව විමසා ඇත. එහිදී සාක්ෂිකරු පවසා ඇත්තේ සෑම වසරකම තමන්ට නිවාඩු ඉතිරිව ඇති බවත් මෙය සියලුම උපශාලාධිපතිවරුන්ට ලබා දුන් පොදු ලිපියක් බවයි.

*ප්‍රශ්නයඃ* තමාගේ 2011 වැටුප් වර්ධකයට අදළව ඔබගේ පැමිණීම අසතුටුදයක මට්ටමක පවත්නා බව නිරීක්ෂණය වූ පසුව (R 3 ලේඛනය කියවා සිටී.) අවවාදයක් ලෙස නේද තමන්ට මේ ලිපිය ලැබිලා තියෙන්නේ?
*උත්තරයඃ* ඔව්. ඔය ලිපිය සියලුම උපශාලාධිපතිවරුන්ට ගැහුවා. මම 2000.01.03 වැනි දින දක්වා නොපේ නිවාඩු එකක්වත් අරගෙන නැහැ. හැම අවුරුද්දෙම නිවාඩු 20, 30, 40 වගේ ඉතිරිවෙලා තියෙනවා. ඔය ලිපිය උප ශාලාධිපතිවරු සියලු දෙනාටම පොදුවේ ගහපු ලිපියක්. මට ඒකට සාක්ෂි ඉදිරිපත් කරන්න පුළුවන් වශයෙන් ප්‍රකාශ කර ඇත.

ඉල්ලුම්කරුගේ වැඩ තහනම් කිරීමේ ලිපිය R4 ලෙස සලකුණු කර එකී ලිපියෙන් පසු ඉල්ලුම්කරු විනය විභාගයට කැඳවා ඇති බව ඉල්ලුම්කරු සිය සාක්ෂියේදී පිළිගෙන ඇති අතර විනය පරීක්ෂණයට කැඳවීම් කල ලිපිය R 5 ලෙස සලකුණු කර ඇත. තවද 2013.08.14 දිනැති, ඉල්ලුම්කරුට ලබා දී ඇති චෝදනා පත්‍රයෙන් ඉල්ලුම්කරු චෝදනා හතරකට වැරදිකරු බව සඳහන්කර ඇති බව පිළිගෙන ඇති අතර එකී ලේඛනය R6 ලෙස සලකුණු කර එහි සඳහන් චෝදනාවන් R 6 a ලෙස සලකුණු කර ඇත. විනය පරීක්ෂණයට තමන්ට කැඳවීමක් ලැබුණු බවත් තමන් ලිඛිත දේශන මගින් සාක්ෂි ලබාදුන් බවත් ඉල්ලුම්කරු ප්‍රකාශකර ඇත. ඊට අමතරව තමන් විනය පරීක්ෂණයට සහභාගි වූ බවද ප්‍රකාශ කර ඇති අතර තමන් ලිඛිත සාක්ෂි සම්පිණ්ඩනයක් ඉදිරිපත් කල බව පිළිගෙන ඇත.

තවද 2013.06.20 දින තමන් සේවයට වාර්තා නොකළ බවත් ඇඟිලි සලකුණු තබා නොමැති බවත් ඉල්ලුම්කරු ප්‍රකාශ කර ඇති අතර එදින
*ප්‍රශ්නයඃ* මේ සිදුවීම සිදුවූ 2013.06.20 වැනි දින තමා සේවා ස්ථානයෙන් බැහැරව සිටියා නේද?
*උත්තරයඃ* ඔව්. එදා මම ටෙලිග්‍රෑම් එකක් ගහලා ඊට පසුදා මගේ නිවාඩු අනුමත කර ගත්තා. එද මම ටෙලිග්‍රෑම් එකක් ගහලා තමයි ගියේ. මම සේවයට වාර්තා කලේ නැහැ. වාර්තා කළා නම් මගේ ඇඟිලි සලකුණු තියෙන්න ඕනේ. මගේ ඇඟිලි සලකණු තියලා නැහැ නිවාඩු එහෙමම අනුමත වෙලා තියෙනවා. වශයෙන් ප්‍රකාශ කර ඇත.

තවද විශ්වවිද්‍යාල ප්‍රතිසම්පාදන කොමිෂන් සභාව නිකුත් කළ චක්‍රලේඛනය R 9 ලෙස සලකුණුකර ඉල්ලුම්කරුගෙන් විමසා ඇත්තේ උපශාලාධිපතිවරයෙකුට අවසරයක් නොමැතිව නිවාඩු ලබාගත නොහැකි බවය. ඉල්ලුම්කරු එකී කරුණ පිළිගෙන ඇත. මේ හැර ඉල්ලුම්කරුගෙන් සාක්ෂි විමසීමේදී ඉල්ලුම්කරු තමන්ගේ ඉහළ නිලධාරියකු වන ''අනුර'' යන අයට බැන වැදීම සම්බන්ධයෙන් පොලිසියේ පැමිණිල්ලක් කර ඇති බව විමසීමේදී ඉල්ලුම්කරු ඒ බව පිළිගෙන ඇති අතර ඒ පිළිබඳව ඉල්ලුම්කරු විසින් පොලිසියට ප්‍රකාශයක් දී ඇති බවද පිළිගෙන ඇත.

තවද ඉල්ලුම්කරුගෙන් සාක්ෂි විමසීමේදී R10 ලේඛනය සලකුණු කරමින් ඉල්ලුම්කරුට වැඩ තහනම් කල කාලය තුළ හිඟ වැටුප් ගෙවා ඇති බව තහවුරු කරගෙන ඇති අතර, ඒ අනුව ඉල්ලුම්කරු විසින් දිවුරුම් ප්‍රකාශය මගින් හිඟ වැටුප් නොගෙවා ඇති බවට කරුණු දක්වීම අභියෝගයට ලක්කර ඇති අතර එහිදී ඉල්ලුම්කරුට අඩ වැටුප් ලබාදී ඇති බව පිළිගෙන ඇත. තවද R11 ලේඛනය හෙවත් විනය නියෝගය ප්‍රකාරව දඬුවම් පැමිණවීමට අදළ ලේඛනය සලකුණු කරමින් ඉල්ලුම්කරු විනය පරීක්ෂණය අනුව චෝදනා හතරටම වැරදිකරු වූවත් සේවයෙන් පහකර නොමැති බවටත්, මූලික වැටුප් පියවර අනුව 2014.02.20 දින සිට නැවත සේවයේ පිහිටුවා ඇති බවටත් කරුණු තහවුරු කරගෙන ඇත. එමෙන්ම ඉල්ලුම්කරු විසින් තමන් අසනීප නිසා ප්‍රතිකාර ලබා ගැනීමට ගිය බවට පොලිසියේදී ප්‍රකාශ කල ද ඒ බවට ආයතනය වෙත වෛද්‍ය වාර්තාවක් ඉදිරිපත් කර නොමැති බවටද කරුණු දක්වා ඇත. තවද ඉල්ලුම්කරු විධිමත්ව නිවාඩු ලබාගෙන නොමැති බව හරස් ප්‍රශ්න විමසීමේදී අභියෝගයට ලක්කර ඇති ඉල්ලුම්කරු ''සරත්'' නැමැති අයෙකු ලවා නිවාඩු ලබා ගැනීමට විදුලි පුවතක් යැවීම R8 C ලේඛනයට අනුව නිත්‍යානුකූල නොවන බවත්, අංශ ප්‍රධානියා විසින් ඉල්ලුම්කරු සේවයෙන් බැහැරව සිටිය අවස්ථාවේදී දුරකථනයෙන් ඒ පිළිබඳව විමසීමේ දී ඔහුට බැන වැදුන බවටත් කරුණු දක්වා ඇති අතර ඉල්ලුම්කරු විසින් එකී කරුණු ප්‍රතික්ෂේප කර ඇත. තවද ඉල්ලුම්කරු වෙනුවෙන් වගඋත්තරකාර ආයතනයෙන් සාධාරණ විනය පරීක්ෂණයක් පැවැත්වූ බවට වග උත්තරකාර පාර්ශ්වය ප්‍රකාශ කළද ඉල්ලුම්කරු එය ප්‍රතික්ෂේප කර ඇත.

ඉල්ලුම්කරුගෙන් නැවත ප්‍රශ්න විමසීමේදී ඉල්ලුම්කරු පත්වීම් ලිපිය අනුව පූර්ණ කාලීනව නේවාසිකාගාරයේ නැවතී සිටි බවට සාක්ෂි ලබාදී ඇත. R3 ලේඛනය හෙවත් සේවා තත්ත්වය සතුටුදායක කර ගන්නා ලෙස අවවාදාත්මක ලිපිය පෙන්වා ප්‍රශ්න කිරීමේදී

එකී අවස්ථාව වන විට තමන් එකම වැටුප් රහිත නිවාඩුවක් හෝ ලබාගෙන නොතිබූ බව ප්‍රකාශ කර ඇත.
ප්‍රශ්නය : ඔය R3 ලේඛනය අනුව ඔබ 2011 වර්ෂයට අදළව එකදු වැටුප් රහිත නිවාඩුවක් හෝ ලබාගෙන තිබෙනව ද?
උත්තර : නැත ස්වාමිනී යනුවෙන් ප්‍රකාශ කර ඇත. තව ද R4 ලිපිය තමාගේ වැඩ තහනම කල ලිපිය බවද, R5 ලිපිය තමන් වෙනුවෙන් විනය පරීක්ෂණ නිලධාරියකු පත් කිරීමේ ලිපියක් බවටද, ඉල්ලුම්කරු හඳුනාගෙන ඇත. R5 ලිපිය ලැබීමට පෙර ඉල්ලුම්කරුට චෝදනා පත්‍රයක් ලැබුණ බව ද ඉල්ලුම්කරු පිළිගෙන ඇත. තමන්ට චෝදනා පත්‍රයෙන් අවසර නැතිව සේවා ස්ථානයෙන් බැහැර ගිය බවට චෝදනා කළද තමන් එදින සේවයට වාර්තා කළ දිනයක් නොවන බවත්, එදින ඇඟිලි සලකුණු යන්ත්‍රයේ පවා අත්සන් තබා නොතිබූ බවත් එබැවින් තමන් නිවැරදිකරු බවත් ඉල්ලුම්කරු ප්‍රකාශ කර ඇත.
*ප්‍රශ්නය : එහෙමනම් තමුන් ඇයි කියන්නේ තමුන් නිවැරදිකරු කියලා ?*
*උත්තරය :* පළමු චෝදනාව තියෙන්නේ සේවා ස්ථානයට පැමිණි අවසරයකින් තොරව සේවා ස්ථානයෙන් බැහැරව ගියා කියලා එද මම ඇඟිලි සලකුණු යන්ත්‍රයේ ඇඟිල්ල තියලා නැහැ. ඒ නිසා පළමු චෝදනාවෙන් මෙම නිදහස් කියලා මම කියනවා යනුවෙන් ඉල්ලුම්කරු ප්‍රකාශ කර ඇත. තව ද තමන් 2013.06.20 දින විදුලි පණිවුඩයක් මඟින් නිවාඩු ලබා ඉන්පසු එම නිවාඩුව අදාළ විදුලි පණිවිඩ කුවිතාන්සිය සමග යොමුකර අනුමත කරවා ගත් බව ද වැඩි දුරටත් ප්‍රකාශ කර ඇත. එකී කරුණු අනුව ඉල්ලුම්කරු අවසරයකින් තොරව සේවා ස්ථානයෙන් බැහැරව ගොස් ඇති බවට කෙරෙන චෝදනාව ප්‍රතික්ෂේප කර ඇත.
ප්‍රශ්නය : ඔබ කිව්වා බැහැර සිටීම පිළි අරගෙන එදින ටෙලිග්‍රෑම් එකක් ගහලා ඊට පසුවදා මගේ නිවාඩු අනුමත කර ගත්තා කියලා. ඒක හරි ද?

*උත්තරය :* එසේය ස්වාමිනී,

මේ අනුව විශ්වවිද්‍යාල ආයතන සංග්‍රහය අනුව එසේ නිවාඩු අනුමත කරගෙන ඇති බව ද ඉල්ලුම්කරු ප්‍රකාශ කර ඇත. තව ද ඉල්ලුම්කරුගෙන් හරස් ප්‍රශ්න විමසීමේ දී සහකාර ලේඛකාධිකාරි අනුර මහතා තමන් සම්බන්ධයෙන් පොලීසියට පැමිණිලිකර ඇති බව ඉල්ලුම්කරු පිළිගෙන ඇති අතර එහිදී පොලීසිය විසින් දෙපාර්ශ්වයට අවවාද කර ඇති බව ද ප්‍රකාශ කර ඇත.

වග උත්තරකාර පාර්ශ්වයේ සාක්ෂි :
වග උත්තරකාර පාර්ශ්වයේ සාක්ෂි 2021.04.08 දින ආරම්භ වූ අතර ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරි W. W. අනුර මහතා සාක්ෂියට කැඳවා ඇත. තමන් 2000 වර්ෂයේ පූර්ණ කාලීන උප ශාලාධිපති ලෙස ද, ඉන්පසු උසස්වීම් ලබා 2012 දී සහකාර ලේඛකාධිකාරි ලෙස ද, සේවය කර 2017 සිට ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී ලෙස ද තමන් සේවය කරන බව ප්‍රකාශ කර ඇත. තමන් ශිෂ්‍ය කටයුතු අංශයේ සේවය කරන අතරතුර ඉල්ලුම්කරු උප ශාලාධිපති ලෙස තමන් භාරයේ සේවය කළ බව සාක්ෂිකරු ප්‍රකාශ කර ඇත. නඩුවට අදළ කරුණ උද්ගතවූයේ තමන් රාජකාරියේ යෙදී සිටිය දී ඉල්ලුම්කරු සමග ඇතිවූ වචන හුවමාරුවක් මත බව සාක්ෂිකරු ප්‍රකාශ කර ඇත. මංජුල ප්‍රසාද් මහතා රාජකාරි කටයුතුවල යෙදී සිටින අතරතුර ශිෂ්‍ය නේවාසිකාගාරවල සනීපාරක්ෂක කටයුතු පිළිබඳව ගැටළු මතු වූ බවත්, මංජුල මහතා ඒවා නිවැරදිව සැකසීමට කටයුතු කර නොමැති බවට පැමිණිලි ලැබී තිබූ බවත් සාක්ෂිකරු වැඩිදුරටත් ප්‍රකාශ කර ඇත. තමන් ඉහල නිලධාරීන් දෙනෙකු සමග රාජකාරි කටයුත්තකට යමින් සිටිය දී බලන්ගොඩ ආසන්නයේ දී ඉල්ලුම්කරු සේවා ස්ථානයෙන් බැහැරව සිටින බව දැකීමේ දී තමන්ට එකී පැමිණිලි ගැන මතකයට පැමිණි අතර ඒ අනුව තමන් දුරකථනයෙන් ඔහුගෙන් සේවා ස්ථානයෙන් බැහැරවීම පිළිබඳව විමසූ බවත් එවිට තමන් නිවාඩු මත සිටින බව පැවසූ බවත් නිවාඩු ගත් බව තමන් නොදන්නා බව පැවසූ විට තමන්ට දොස් තබමින් තර්ජනය කල බව ද ප්‍රකාශ කර ඇත. ඉන්පසු තමන් 2013.06.21 ලිපියෙන් උප කුලපති තුමාට මේ පිළිබඳව වාර්තා කළ බව ද ප්‍රකාශ කරමින් එකී ලිපිය R12 වශයෙන් සලකුණු කර සාක්ෂි ලබා දී ඇත. මේ හැර තමන් විසින් මේ පිළිබඳව පොලීසියට කළ පැමිණිල්ල ද සාක්ෂිකරු විසින් R13 ලෙස සලකුණු කර සාක්ෂි ලබා දී ඇත. මේ හැර සිදුවීම සම්බන්ධයෙන් සිදුකළ ගෘහස්ථ විනය පරීක්ෂණයේ සාක්ෂි සටහන R7 ලෙස සලකුණු කර සාක්ෂි ලබා දී ඇත. කෙසේ වුව ද මෙහි දී එකී ලේඛනයේ ඉල්ලුම්කරු විසින් ගෘහස්ථ පරීක්ෂණයේ දී ලබාදුන් සම්පූර්ණ සාක්ෂිය නොමැති බවට ඉල්ලුම්කාර පාර්ශ්වය විසින් සාක්ෂි විමසීමේ දී හබකර ඇති අතර සාක්ෂිකරු ඒ පිළිබඳව තමන් දැනුවත් නොවන බව ප්‍රකාශ කර ඇත.

තව ද, R3 ලේඛනය අනුව 2011 වර්ෂයේ ඉල්ලුම්කරුගේ පැමිණීම අසතුටුදයක තත්ත්වක පවතින බවට කරන ලද චෝදනාව සම්බන්ධයෙන් හරස් ප්‍රශ්න විමසා ඇති අතර එහි දී ඉල්ලුම්කාර පාර්ශ්වය විමසා ඇත්තේ විශ්වවිද්‍යාල චක්‍රලේඛ අනුව වැටුප් වර්ධක ලබා දෙනුයේ සේවයට පැමිණීම, හැසිරීම සතුටුදයක ලෙස පවතිනවා ද යන්න සොයා බලා බව පිළිගන්නේ ද යන්නයි. ඉල්ලුම්කරු එය පිළිගෙන ඇත. තව ද, R6 ලේඛනය පෙන්වා හරස් ප්‍රශ්න විමසා ඇති අතර, එකී ලේඛනයට අනුව ඉල්ලුම්කරුට 2011 වර්ෂය සඳහා ලබා නොගත් ඉතිරි නිවාඩු 63 1/2 ක් ඇති බවත්, එසේ තිබිය දී ඉල්ලුම්කරුට R3 අවවාද කිරීමේ ලිපිය නිකුත් කර ඇති බව, විමසා ඇති අතර එකී කරුණ සාක්ෂිකරු පිළිගෙන ඇත.
තව ද, උපශාලාධිපති 2 තනතුරට නිවාඩු අනුමත කර ගන්නේ නම් විශේෂ චක්‍ර ලේඛනයක් ඇති බවත් එකී චක්‍ර ලේඛනය R9 ලෙස සලකුණු කර සාක්ෂි ලබා දී ඇති අතර එකී චක්‍ර ලේඛය පරිදි නිවාඩු අනුමත කරන නිලධාරියා විසින් නේවාසිකාගාරවල තත්ත්වය යහපත්ව පවතින බවට දැනුවත් විය යුතු බවත්, ඉල්ලුම්කරු විසින් නිවාඩු ලබාගන්නා බවට ඔහුගේ අධීක්ෂණ නිලධාරියා වන තමන්

දැනුවත් නොකළ බවත්, ඒ අනුව ඔහු සිදුවීම සිදුවූ දින රාජකාරි පැහැර ඇති බවත් ප්‍රකාශ කර ඇත. ඒ අනුව ඉල්ලුම්කරුට R6 නැමැති චෝදනා පත්‍රය නිකුත් කර ඇති බවත්, එකී චෝදනා පත්‍රය විභාගයට ගෙන R11 නමැති නියෝගය ලබාදී ඇති බවත් වැඩි දුරටත් ප්‍රකාශ කර ඇත.

2022.05.27 දින වැඩිදුර හරස් ප්‍රශ්න විමසීමේ දී R4 ලේඛනය අනුව 4 (ඒ) පරිදි සාක්ෂිකරු විසින් කරන ලද පැමිණිල්ලකට අනුව ඉල්ලුම්කරුගේ වැටුප් නතර කර ඇති බව සාක්ෂිකරුගෙන් හරස් ප්‍රශ්න විමසීමේ දී පිළිගෙන ඇත. තව ද සාක්ෂිකරු විසින් ඉල්ලුම්කරුට විරුද්ධව පැමිණිල්ල කළ දිනට පසු දිනම එකී පැමිණිල්ල පාලක සභාවට ඉදිරිපත්කර ඉල්ලුම්කරුගේ සේවය අවසන් කර ඇති බව වග උත්තරකාර පාර්ශ්වයේ සාක්ෂිකරුගෙන් හරස් ප්‍රශ්න විමසීමේ දී පිළිගෙන ඇත. තව ද එලෙස ඉල්ලුම්කරුගේ වැඩ තහනම් කිරීමට පෙර මූලික පරීක්ෂණයක් නොකළ බවද සාක්ෂිකරු පිළිගෙන ඇත. මේ අනුව ඉල්ලුම්කරුගේ වැඩ තහනම් කිරීම නිශ්චිත පරීක්ෂණයකට පෙර ලබාගත් තීරණයක් බව ද පැහැදිලි වේ.

තව ද, සාක්ෂිකරු ඉල්ලුම්කරු විසින් 2013.06.20 දින බැන තර්ජනය කිරීම,සම්බන්ධයෙන් තම ආයතනයට R12 මගින් පැමිණිල්ලක් කල බව, ඊට පෙර R13 මගින් සාක්ෂිකරු පොලීසියටද පැමිණිලි කර ඇති බවට සාක්ෂිකරුගෙන් හරස් ප්‍රශ්න විමසීමේ දී පිළිගෙන ඇත. එකී R13 පැමිණිල්ල සම්බන්ධයෙන් පොලීසිය විසින් දෙපාර්ශ්වයම කැඳවා විභාගයට ගත් අවස්ථාවේ එය සමථයට පත් වූ බව ද සාක්ෂිකරු පිළිගෙන ඇත. මේ අනුව පොලිසියට කරන ලද පැමිණිල්ල සමථයට පත්වූ බව සඳහන් කිරීමෙන් පෙනී යන්නේ යම් සිද්ධියක් ඇතිවූ පසු දෙපාර්ශ්වය පොලීසිය මැදිහත්ව සමාදානයට පත්කළ බවයි. එකී කරුණු මත දෙපාර්ශ්වය අතර යම් ආරවුලක් ඇතිව තිබූ බව තහවුරු වේ.

මේ හැර ඉල්ලුම්කරු විසින් ඉදිරිපත් කර ඇති R7 ලේඛනය ඉල්ලුම්කරුගේ විනය පරීක්ෂණ සටහන්වල කොටසක් පමණක් බවට වග උත්තරකාර පාර්ශ්වය හබකර ඇති අතර සාක්ෂිකරු එය පිළිගෙන ඇත. මේ හැර ඉල්ලුම්කරුට විරුද්ධව පැවති විනය පරීක්ෂණයේ දී ලබාදුන් මූලික සාක්ෂි සහ හරස් ප්‍රශ්න R7 ලේඛනයේ නොමැති බවට සාක්ෂිකරුගෙන් හරස් ප්‍රශ්න විමසීමේ දී ප්‍රශ්න කර ඇති අතර සාක්ෂිකරු ප්‍රකාශ කර ඇත්තේ ලේඛන ඉදිරිපත් කරමින් ප්‍රකාශ කරන්නේ නම් ඒ බව පිළිගන්නා බවයි. තව ද, ඉල්ලුම්කරුට විරුද්ධව පැවති විනය පරීක්ෂණයේ දී තමන්ගේ සාක්ෂිය හැර වෙනත් සාක්ෂි ඉදිරිපත් නොවූ බව ද සාක්ෂිකරු පිළිගෙන ඇති අතර ලේඛන වශයෙන් තමන්ගේ පැමිණිල්ල ඉදිරිපත් වූ අතර පොලීසියට තමන් කරන ලද පැමිණිල්ල ඉදිරිපත් කලේ සාක්ෂි දීමෙන් පසුව බව ද සාක්ෂිකරු පිළිගෙන ඇත. පොලීසියට කළ පැමිණිල්ල සම්බන්ධයෙන් ප්‍රශ්න කරමින් සිටිය දී එකී පොලිස් පැමිණිල්ල ගැන මෙසේ ප්‍රශ්න කර ඇත.

*ප්‍රශ්නය : ඒක තමන් සාක්ෂි දුන්නට පස්සේ නේද ඉදිරිපත් කරලා තියෙන්නේ ?*

*උත්තර : ඔව්* මේ අනුව විනය පරීක්ෂණය සම්බන්ධ සාක්ෂි විමසීමේ දී පොලිසියට කරන ලද පැමිණිල්ල සාක්ෂි විමසීමට භාජනය නොවූ බව ද, ඉහත කරුණු අනුව තහවුරු වේ.

තව ද සේවක වැටුප් වර්ධක ලබාදීම සේවකයාගේ කාර්යක්ෂමතාවය, අවංකකම ආදී යහපත් ක්‍රියා මත ලැබෙන වරප්‍රසාදයක් බවට ඉල්ලුම්කාර පාර්ශ්වයෙන් හරස් ප්‍රශ්න කිරීමේ දී විමසා ඇති අතර වග උත්තරකාර පාර්ශ්වය ද එය පිළිගෙන ඇත.

*ප්‍රශ්නය : මම යෝජනා කරනවා වැටුප් වර්ධක උපයා ගන්නා පස් වැදෑරුම් යහපත් කාර්ය සාධනයක් තියෙන්න ඕන කියලා?*

*උත්තර : ඔව් ඒක තමයි මම පැහැදිලි කරන්න උත්සාහ කරන්නේ.*යනුවෙන් ප්‍රකාශ කර ඇති අතර ඒ අනුව යහපත් කාර්ය සාධනය මත වැටුප් වර්ධක උපයා ගන්නා බව තහවුරු කර ඇත.

ආයතන සංග්‍රහයේ 4:1:2 කොටස R 14 ලේඛනය වශයෙන් සලකුණු කර සාක්ෂිකරුගෙන් සාක්ෂි විමසා ඇති අතර, R 14 ඒ යටතේ ඉල්ලුම්කරුට බරපතල දඬුවම් නියම කර ඇති බව සාක්ෂිකරු පිළිගෙන ඇත. තව ද, එකී කොටස අනුව ඉදිරි හෝ පසු වැටුප් වර්ධක නතර කල හැකි ද යන්න නිශ්චිතව දක්වා නොමැති බව ද සාක්ෂිකරු පිළිගෙන ඇත.

තව ද, A 7 වශයෙන් ලේඛනයක් සලකුණු කර සාක්ෂිකරුගෙන් සාක්ෂි විමසා ඇති අතර ඊට අනුව ඉල්ලුම්කරු 2013.06.20 දින ඇඟිලි සලකුණු යන්ත්‍රයේ අත්සන් තබා නොමැති බව සාක්ෂිකරු පිළිගෙන ඇත. තව ද, (A5ඒ) ලේඛනය අනුව 2013.06.20 දින ඉල්ලුම්කරු නිවාඩු ගෙන ඇති බව ද, එය ඔහුගේ නිවාඩු අඩුකරගෙන ඇති බව ද, සාක්ෂිකරුගෙන් හරස් ප්‍රශ්න විමසීමේ දී තහවුරු වී ඇත.

*ප්‍රශ්නය : ඒ-5(ඒ) අනුව 2013.06.20 වන දින ඉල්ලුම්කරු නිවාඩු ලබාගත් බවට විශ්වවිද්‍යාල නිවාඩු ලේඛනයේ තුලනය අනුව වාර්තා වෙලා තියෙනවා නේ ද?*

*උත්තර :ඔව්.*යනුවෙන් ප්‍රකාශ කිරීමෙන් ඒ බව තහවුරු වේ. මේ අනුව සාක්ෂිකරු විසින්ම එම නිවාඩුව අනුමත කර ඇති බව හරස් ප්‍රශ්න විමසීමේ දී ප්‍රශ්න කර ඇති අතර තමන් එය පිළිගැනීම හෝ ප්‍රතික්ෂේප කිරීම නොකරන බව සාක්ෂිකරු ප්‍රකාශ කර ඇත. කෙසේ වුව ද සාක්ෂිකරු තවදුරටත් ප්‍රකාශ කර ඇත්තේ විශ්වවිද්‍යාලයේ නිවාඩු ලබා ගැනීමේ ක්‍රමවේදය මත ඉල්ලුම්කරු විසින් විධිමත් පරිදි නිවාඩු ඉල්ලුම්පත ඉදිරිපත්කර නොමැති බවයි. මේ හැර R 4 ලේඛනය පෙන්වා ප්‍රශ්න කර ඇති අතර එහී දී සාක්ෂිකරු ප්‍රකාශ කර ඇත්තේ පූර්ව අනුමැතියකින් තොරව නිවාඩු ලබාගත්තේ ය යන කරුණ අසත්‍ය බවත් 2013.06.20 දින ඉල්ලුම්කරු සේවයට වාර්තා නොකළ බවත් ය.

ප්‍රශ්නය : ආර්-4 ලේඛනය මගින් 2013.06.20 දින පූර්ව අවසරයක් නොමැතිව සේවයට වාර්තා කිරීමෙන් පසු සේවයෙන් බැහැරව සිටියා කියන එක අසත්‍යක් නේ ද?

උත්තරය : ඔව්.යනුවෙන් පවසමින් ඒ බව තහවුරු කර ඇත. කෙසේ වුව ද ඉල්ලුම්කරු විධිමත්ව නිවාඩු ලබා නොගත් හෙයින් තමන්ට ඒ වෙනුවට වෙනත් සේවකයකු සේවයේ යෙදවීම නොහැකි වූ බව සාක්ෂිකරුගෙන් නැවත ප්‍රශ්න විමසීමේ දී වැඩි දුරටත් ප්‍රකාශ කර ඇත.මේ අනුව ඉල්ලුම්කරු නිවාඩු ලබාගෙන සේවා ස්ථානයෙන් බැහැරව ගිය බව තහවුරු වන අතර විශ්වවිද්‍යාල කාර්ය පරිපාටියෙන් බැහැරව එසේ නිවාඩු ලබාගෙන ඇති බවට ඉල්ලුම්කරුට චෝදනා එල්ල වී ඇත. කෙසේ වුව ද ඉල්ලුම්කරුගේ නිවාඩු ඉල්ලුම්පත වග උත්තරකරු විසින් අනුමත කර ඇති අතර ඒ අනුව ඉල්ලුම්කරු අවසරයකින් තොරව ආයතනයෙන් බැහැරව ගිය බව සනාථ නොවේ.

සාක්ෂි විමසීම අවසානයේ දී දෙපාර්ශ්වය විසින්ම සිය ලිඛිත දේශන ඉදිරිපත් කර ඇති අතර ඉල්ලුම්කාර පාර්ශ්වය සිය ලිඛිත දේශනය මගින් ප්‍රකාශ කර ඇත්තේ තමන්ට වග උත්තරකාර පාර්ශ්වය විසින් අසාධු චෝදනාවක් එල්ල කර ඒ මත විනය පරීක්ෂණයක් පවත්වා එකී විනය පරීක්ෂණයේ දී තහවුරු නොවූ කරුණු මත දඬුවම් නියම කර ඇති බවත්, තමන් එවැනි චෝදනාවන්ට වැරදිකරු නොවන බැවින් එලෙස දඬුවම් නියම කිරීම අසාධාරණ සහ අයුක්ති සහගත බව ද වැටුප් විලම්භනය කිරීමෙන් තමන්ට දැඩි අගතියක් සිදුව ඇති බව ද ප්‍රකාශ කර ඇත.

තව ද, විනය පරීක්ෂණ වාර්තාව වග උත්තරකාර පාර්ශ්වය විසින් ගරු අධිකරණයට යොමු නොකිරීමෙන්ම පළමු පාර්ශ්වයට එල්ල වී ඇති චෝදනා ඔප්පු නොවී ඇති බව ද, පරීක්ෂණ නිලධාරියාගේ නිගමන සනාථ වී නොමැති බව ද, ඉල්ලුම්කාර පාර්ශ්වය අවධාරණය කර ඇත. එමෙන්ම ඉල්ලුම්කරුට විරුද්ධව ප්‍රධාන චෝදනාව වන සහකාර ලේඛකාධිකාරිවරයාට දුරකථනයෙන් බැන වැදුන බවත් එම අවස්ථාවේ තම ආයතනයේ ඉහල නිලධාරීන් දෙදෙනෙකු එම ස්ථානයේ සිටි බව ද, වගඋත්තරකරුගේ සාක්ෂියේ දී ප්‍රකාශ කර ඇතත් වග උත්තරකරු සිය සාක්ෂියේ දී ඒ බව සනාථ කිරීමට සාක්ෂි ඉදිරිපත් කර නොමැති බව ද ඉල්ලුම්කරු විසින් සිය ලිඛිත දේශනය මගින් ප්‍රකාශ කර ඇත. තව ද ඉල්ලුම්කාර පාර්ශ්වය වැඩි දුරටත් ප්‍රකාශ කර ඇත්තේ 2013.06.20 දින තමන් නිවාඩු අනුමත කරගෙන සේවා ස්ථානයෙන් බැහැරවගොස් සිටි බවත්, ඒ අනුව අවසරයකින් තොරව සේවා ස්ථානයෙන් බැහැරව සිටි බවට චෝදනා කළ නොහැකි බවත්ය. තවද වග උත්තරකාර පාර්ශ්වයේ සාක්ෂිකරු තම පැමිණිල්ල ඔප්පු කිරීමට කිසිදු වාචික හෝ ලිඛිත සාක්ෂියක් ඉදිරිපත් නොකළ බව හරස් ප්‍රශ්න විමසීමේ දී පිළිගෙන ඇති බවත් එසේ තිබිය දී R11 මගින් බරපතල දඬුවම් ලබාදීම අසාධාරණ බවත් ඉල්ලුම්කාර පාර්ශ්වය ප්‍රකාශ කර ඇති අතර, වැඩි දුරටත් ප්‍රකාශ කර ඇත්තේ උපයා ගෙන භුක්ති විඳිමින් සිටි වැටුප් වර්ධක විලම්බනය කිරීමට අදාළ දඬුවමක් ආයතන සංග්‍රහයේ XXII වන පරිච්ඡේදයේ නොමැති බවයි. තව ද ආයතන සංග්‍රහයේ 10:1 සහ 10:2 වගන්ති උපුටා දක්වමින් සහ ගොනු කරමින් ඉල්ලුම්කරු වැඩිදුරටත් ප්‍රකාශ කර ඇත්තේ එකී වගන්ති අනුව වැටුප් වර්ධක විලම්භනය කිරීම් අතීතයට බලපාන ලෙස සිදුකල නොහැකි බවයි. මේ හැර ඉහල අධිකරණ තීරණ ද උපයෝගී කර ගනිමින් ඉල්ලුම්කාර පාර්ශ්වය වැඩි දුරටත් ප්‍රකාශ කර ඇත්තේ සේවය අත්හිටවූ කාලයට අදළ සියලුම හිඟ වැටුප් සහ දීමනා ගෙවිය යුතු බවයි. අවසාන වශයෙන් ඉල්ලුම්කාර පාර්ශ්වය සිය ලිඛිත සැලකිරීම් වලින් අයැද ඇත්තේ R11 මගින් පනවා ඇති දඬුවම් බල රහිත කොට අහිමි කර ඇති සියලු වැටුප් වර්ධක සහ හිඟ වැටුප් ලබාදෙන ලෙසය.

වග උත්තරකාර පාර්ශ්වය සිය ලිඛිත දේශනය 2022 ජූලි 21 දින ඉදිරිපත් කර ඇත. ඒ අනුව වග උත්තරකාර පාර්ශ්වය ප්‍රකාශ කර සිටින්නේ ඉල්ලුම්කරු පූර්ව අවසරයක් නොමැතිව 2013.06.20 දින සේවා ස්ථානයෙන් බැහැරව සිටි අවස්ථාවක ඔහුගේ අධීක්ෂණ නිලධාරි W. W. අනුර මහතා ඒ පිළිබඳව දුරකතනයෙන් විමසූ විට අනුර මහතාට අවිනීත ලෙස අමතමින් ජීවිත තර්ජන එල්ල කල බැවින් පැමිණිලිකරුගේ වැඩ තහනම් කර R4 ලේඛනය මගින් දඬුවම් නියම කර ඇති බවයි. තව ද උසස් අධ්‍යාපන ආයතන සංග්‍රහයේ 2:2:7 අනු ඡේදය යටතට ගැනෙන විෂමාචාර සිදුකර ඇති බැවින් ඉල්ලුම්කරුට R6 චෝදනා පත්‍රය නිකුත්කර විධිමත් විනය පරීක්ෂණයක් සිදුකර විනය පරීක්ෂණයේ තීන්දුව මත අභියාචනා කිරීමෙන් පසු නැවත සේවයේ පිහිටුවා වැඩ තහනම් කළ කාලය සඳහා අඩ වැටුප් ද ගෙවා ඇති බව ද ප්‍රකාශ කර ඇත. මේ හැර R3 ලේඛනයට අවධානය යොමු කරමින් ප්‍රකාශ කර ඇත්තේ ඒ අනුව ඉල්ලුම්කරුගේ සේවය අසතුටුදායක මට්ටමක පවතින බවයි. ඒ බව ඉල්ලුම්කරු සහ වග උත්තරකරුගේ සාක්ෂි උපුටා දක්වමින් තහවුරු කිරීමට ද උත්සාහ ගෙන ඇත. තව ද මෙම ඉල්ලුම්කරු විධිමත්ව නිවාඩු ලබා නොගෙන සේවා ස්ථානයෙන් බැහැරව ගොස් ඇති බව තහවුරු කිරීමට වග උත්තරකාර පාර්ශ්වය උත්සාහ ගෙන ඇත. එහි දී විධිමත් යනුවෙන් වග උත්තරකාර පාර්ශ්වය අදහස් කර ඇත්තේ නේවාසිකාගාර පාලකවරයකු නිවාඩු ලබාගන්නා විට වෙනත් අයෙකුට එම පාලනය භාර දී නිවාඩු ලබාගත යුතු යන්න අදහස් වන බව වග උත්තරකරුගේ ලිඛිත කරුණු සැලකිරීම්වල පැහැදිලි කර ඇත. තව ද ඉල්ලුම්කරු පොලීසියට දී ඇති කට උත්තරය අනුව ඔහු අසනීප හේතුවෙන් නිවාඩු ලබාගත් බව සටහන්ව ඇති බවත්, කෙසේ වුව ද ඔහුගෙන් නිවාඩු සම්බන්ධයෙන් විමසීමේ දී ඔහු අංශ ප්‍රධානියාට ප්‍රකාශ කර ඇත්තේ තමන් යහලුවකුගේ ගෙදර යන ගමන් යයි පැවසූ බවත් ය. ඒ අනුව ඉල්ලුම්කරුගේ සාක්ෂිවල පරස්පර විරෝධී බවක් ඇති බව වග උත්තරකාර පාර්ශ්වය ප්‍රකාශ කර ඇත.

තව ද වගඋත්තරකාර පාර්ශ්වයේ සාක්ෂිකරු වන අනුර මහතාට බැන තර්ජනය කිරීම් සම්බන්ධයෙන් ඔහු පොලීසියට පැමිණිලි කල බව R12 පොලිස් පැමිණිල්ල ඉදිරිපත් කර ඉල්ලුම්කාර පාර්ශ්වය විසින් ප්‍රකාශ කර ඇත. එමෙන්ම දෙපාර්ශ්වය විසින් පොලිස් විමර්ශනයේ දී එය සමථයකට පත්වූ බව ද වැඩි දුරටත් ප්‍රකාශ කර ඇත. මේ හැර ඉල්ලුම්කරුට වැටුප් විලම්බනය කිරීම ආයතන

සංග්‍රහය අනුව සිදුකර ඇති බවත් ඉල්ලුම්කරු වැඩ තහනම්ව සිටි කාලයට අඩ වැටුප් ගෙවා ඇති බවත් ලිඛිත සැලකිරීම්වල සඳහන් වේ. මීට අමතරව ඉහල අධිකරණ තීරණ සහ සාධාරණත්ව සංකල්පය පිළිබඳව වූ ''සාධාරණත්වය බලාපොරොත්තුව පැමිණෙන්නා පිරිසිදු දෑතින් පැමිණිය යුතුය.'' යන ආප්තය ද උපයෝගී කර ගනිමින් වග උත්තරකාර පාර්ශ්වය ප්‍රකාශ කර ඇත්තේ කාර්මික නීතිය යටතේ කරන ප්‍රදානයන් සාධාරණත්වය මත සිදුවිය යුතු බවයි.

*සාක්ෂි විශ්ලේෂණය සහ ප්‍රදානය ඉදිරිපත් කිරීමේ ස්ථාවරයː*

ප්‍රදානය ලබාදීමේ දී දෙපාර්ශ්වයේ ලිඛිත සැලකිරීම්, සාක්ෂි සහ ලිඛිත දේශන ආදී සියලු මූලාශ්‍ර පරිශීලනය කළ අතර ඒ අනුව හෙළිදරව් වූ තොරතුරු මත ප්‍රදානය සකස් කිරීමට කටයුතු කරන ලදී.

මෙම නඩුවට පසුබිම් වූ මූලික සිද්ධිය වන්නේ නඩුවේ ඉල්ලුම්කරු විසින් නිසි අවසරයකින් තොරව රාජකාරි කාලය තුළ සේවා ස්ථානයෙන් බැහැරව යාම සහ තම අධීක්ෂණ නිලධාරියා ඒ පිළිබඳව විමසූ විට එකී නිලධාරියාට බැන තර්ජනය කිරීම යන්න වේ. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව සහ උසස් අධ්‍යාපනය සම්බන්ධයෙන් වූ ආයතන සංග්‍රහයේ ප්‍රතිපාදන අනුව ඉල්ලුම්කරුට එකී කරුණ සම්බන්ධයෙන් විනය පරීක්ෂණයකින් පසුව බරපතල දඬුවම් පමුණුවා ඇති බව දෙපාර්ශ්වයේම සාක්ෂි විමසීම් තුළින් පැහැදිලි වේ. මෙහි දී විසඳිය යුතු කරුණ වන්නේ,

01. එකී චෝදනාවන් වන

(i) 2013.06.20 දින ඉල්ලුම්කරු අවසරයකින් තොරව සේවා ස්ථානයෙන් බැහැරව සිටි බව

(ii) සහ ඒ පිළිබඳව ඉල්ලුම්කරුගේ අධික්ෂණ නිලධාරියා විසින් විමසීම් කළ විට ඔහුට බැන තර්ජනය කළ බව යන චෝදනා සාධාරණ සැකයෙන් තොරව ඔප්පු වී ඇත් ද?

02. මෙම චෝදනාවන්ට අදාළව දෙපාර්ශ්වයම කැඳවා සිදුකල විනය පරීක්ෂණය කොතෙක් දුරට සාධාරණ සහ යුක්ති සහගත ද?

03. එකී චෝදනා මත ඉල්ලුම්කරුට ලබා දී ඇති දඬුවම් කොතෙක් දුරට සාධාරණ ද යන්න වේ.

මෙම නඩුව විභාගයට ගැනීමට පෙර මේ පිළිබඳව දෙපාර්ශ්වය විසින්ම ලිඛිත කරුණු සැලකිරීම් කර ඇති අතර ඉල්ලුම්කරුගේ ලිඛිත කරුණු සැලකිරීම් මගින් දක්වා ඇත්තේ ඉල්ලුම්කරුට ලබා දී ඇති චෝදනා පත්‍රයේ සඳහන් මූලික චෝදනා වන

(i) ඉල්ලුම්කරු 2013.06.20 දින අවසරයකින් තොරව සේවා ස්ථානයෙන් බැහැරව සිටි බවට කරන චෝදනාව ප්‍රතික්ෂේප කර ඇති අතර එදින තමන් නිවාඩු ලබා සේවයට වාර්තා නොකළ බැවින් එකී චෝදනාව ප්‍රතික්ෂේප කරන බවයි.

(ii) තමන් අධීක්ෂණ නිලධාරියාට බැන තර්ජනය කිරීමක් නොකළ බව ද ප්‍රකාශ කර ඇති අතර ඒ අනුව එකී චෝදනා මත තමන්ට දඬුවම් පැමිණ වීම අසාධාරණ බව වැඩි දුරටත් ප්‍රකාශ කර ඇත.

එකී කරුණු ප්‍රතික්ෂේප කරමින් වගඋත්තරකාර පාර්ශ්වය ප්‍රකාශ කර ඇත්තේ ඉල්ලුම්කරු විසින් අවසරයකින් තොරව රාජකාරි අවස්ථාවේ සේවා ස්ථානයෙන් බැහැරව සිටි බවත් ඒ පිළිබඳව අධික්ෂණ නිලධාරියා කරුණු විමසීමේ දී ඔහුට බැන තර්ජනය කිරීම හේතුවෙන් විධිමත් විනය පරීක්ෂණයකින් පසුව ඔහුට දඬුවම් නියම කර ඇති බවත් ය.

ඉල්ලුම්කරුගේ පැමිණිල්ල සම්බන්ධයෙන් බේරුම්කරණය විසින් නඩුව විභාගයට ගෙන ඇති අතර එහි දී ඉල්ලුම්කරු සිය සාක්ෂි දිවුරුම් ප්‍රකාශයක් මගින් ඉදිරිපත් කර ඇති අතර වග උත්තරකාර පාර්ශ්වය විසින් ඉල්ලුම්කරුගේ සාක්ෂි හරස් ප්‍රශ්නවලට භාජනය කරමින් හබ කිරීම් කර ඇත.

මෙහි දී ද ඉල්ලුම්කරු ප්‍රකාශ කර ඇත්තේ තමන් සේවා ස්ථානයෙන් බැහැරව ඇත්තේ නිවාඩු ලබාගෙන බවයි.

ප්‍රශ්නයː- මේ සිදුවීම සිදුවූ 2013.06.20 වන දින තමා සේවා ස්ථානයෙන් බැහැරව සිටියා නේ ද?

උත්තරයː- ඔව්, එදා මම ටෙලිග්‍රෑම් එකක් ගහලා ඊට පසුදා මගේ නිවාඩු අනුමත කර ගත්තා. එදා මම ටෙලිග්‍රෑම් එකක් ගහලා තමයි ගියේ. මම සේවයට වාර්තා කලේ නැහැ. වාර්තා කළා නම් මගේ ඇඟිලි සලකුණු තියෙන්න ඕනේ. මගේ ඇඟිලි සලකුණු තියලා නැහැ. නිවාඩු එහෙමම අනුමත වෙලා තියෙනවා. වශයෙන් ප්‍රකාශ කර ඇත. (2020.08.12 සාක්ෂි පිටු අංකː 20) මේ අනුව ඉල්ලුම්කරු මෙදින සේවා ස්ථානයෙන් බැහැරව සිටිය ද, එසේ කර ඇත්තේ නිවාඩු ලබා ගැනීමෙන් අනතුරුව බැවින් ද සහ ඔහු එදින ඇඟිලි

සලකුණු නොතබා ඇති බවට සාක්ෂි ලබාදී ඇති හෙයින් ද රාජකාරි අවස්ථාවේ අනවසරයෙන් සේවා ස්ථානයෙන් බැහැරව සිටි බව තහවුරු නොවේ.

තවද 2022.02.25 දින වග උත්තරකාර පාර්ශ්වයේ සාක්ෂිකරුගෙන් ඉල්ලුම්කාර පාර්ශ්වය විසින් හරස් ප්‍රශ්න විමසීමේදී වග උත්තරකාර ආයතනය විසින් පවත්වාගෙන යනු ලබන නිවාඩු ලේඛනය අනුව ඉල්ලුම්කරු 2013.06.20 දින නිවාඩු ලබාගෙන ඇති බව පිළිගෙන ඇත.

*ප්‍රශ්නය:* එම දිනය ඉදිරියේ සම්පූර්ණ වැටුප් සහිත විවේක කියන තීරුව යටතේ 01 කියලා එක දිනයක් නිවාඩු ලබාගෙන ඇති බවට තහවුරු කරගෙන තිබෙනවා නේද?

*උත්තරය:* ඔව්. යනුවෙන් පිළිතුරු දී ඇත. (2022.02.25) සාක්ෂි සටහන් පිටු අංක : 15, 16.

තවද ඉල්ලුම්කාර පාර්ශ්වය විසින් වග උත්තරකාර පාර්ශ්වයේ සාක්ෂිකරු වැඩිදුරටත් හරස් ප්‍රශ්න සඳහා භාජනය කරමින්, පහත පරිදි විමසීම් කර ඇත.

*ප්‍රශ්නය :* R6 හි පළමු චෝදනාව කියවයි. කෙටියෙන් කිව්වොත් 2013.06.20 වන දින අවසරයකින් තොරව සේවා ස්ථානයෙන් බැහැර වුනා කියන එක තමයි කියන්නේ.

පිළිතුර : ඔව්.

*ප්‍රශ්නය :* නමුත් තමා මොහොතකට පෙර පිළිගත්තා නේද 2013.06.20 වන දින ඉල්ලුම්කරු ඇඟිලි සලකුණු ලේඛනයේ සටහන තබලා සේවයට වාර්තා කරලා නැහැ කියලා.

*පිළිතුර :* ඔව්. යනුවෙන් පිළිතුරු දී ඇත. ඒ අනුව ඉල්ලුම්කරු සේවයට පැමිණීම සටහන් තබා නොමැති බව තහවුරු වේ. එසේනම් එදින අවසර නොමැතිව සේවා ස්ථානයෙන් බැහැරව යාමක් සිදුවූයේද යන්න සාධාරණ සැකයකින් තොරව ඔප්පු වී නොමැත.

තවද, ඉල්ලුම්කරුගෙන් හරස් ප්‍රශ්න විමසීමේ දී තමන් අවසරයකින් තොරව ආයතනයෙන් බැහැරව ගිය බව ප්‍රතික්ෂේප කර ඇති අතර,

*ප්‍රශ්නය :* ඔබ කිව්වා බැහැර සිටීම පිළි අරගෙන එදින ටෙලිග්‍රෑම් එකක් ගහලා ඊට පසුවදා මගෙන් නිවාඩු අනුමත කර ගත්තා කියලා. ඒක හරිද?

*උත්තරය :* එසේය ස්වාමිනි. යනුවෙන් ප්‍රකාශ කර ඇත. එසේ නිවාඩු ලබාගෙන සිටියේ නම් බැහැර යාමට අවසරයක් අවශ්‍ය නොවන බවද මෙයින් තහවුරු වේ.

මේ අනුව ඉල්ලුම්කරු මෙදින සේවා ස්ථානයෙන් බැහැරව සිටියද, ඉල්ලුම්කරු එසේ කර ඇත්තේ නිවාඩු ලබා ගැනීමෙන් අනතුරුව බව සහ ඔහු එදින ඇඟිලි සලකුණු නොතබා ඇති බවට ඉල්ලුම්කරු සාක්ෂි ලබාදී ඇති අතර, වග උත්තරකාර පාර්ශ්වයේ සාක්ෂිකරු විසින්ද, ආයතනයේ නිවාඩු ලේඛනය අනුව සාක්ෂි දෙමින් ඊට අනුව 2013.06.20 දින ඉල්ලුම්කරු නිවාඩු අනුමත කරගෙන ඇති බවද ප්‍රකාශ කර ඇත. ඒ අනුව එකී දිනයෙහි ඉල්ලුම්කරු නිවාඩු අනුමත කරගෙන රාජකාරියට වාර්තා නොකළ දිනයක් බව දෙපාර්ශ්වයේම සාක්ෂි මත හෙළිදරව් වී ඇත. ඒ අනුව ඉල්ලුම්කරු රාජකාරි අවස්ථාවේ සේවයෙන් බැහැරව සිටියද, අනවසරයෙන් සේවා ස්ථානයෙන් බැහැරව සිටි බවට කර ඇති චෝදනාව සාධාරණ සැකයෙන් තොරව තහවුරු වී නොමැති බව නිගමනය කරමි.

තවද, R6 ලේඛනය පෙන්වා හරස් ප්‍රශ්න විමසා ඇති අතර එකී ලේඛනයට අනුව ඉල්ලුම්කරුට 2011 වර්ෂය සඳහා ලබා නොගත් ඉතිරි නිවාඩු 63 1/2 ක් ඇති බවත්, එසේ තිබියදී ඉල්ලම්කරුට R3 අවවාද කිරීමේ ලිපිය නිකුත් කර ඇති බව, සම්බන්ධයෙන් හරස් ප්‍රශ්න විමසීමේ දී කරුණු විමසා ඇති අතර එකී කරුණ සාක්ෂිකරු පිළිගෙන ඇත. මේ අනුව ඉල්ලුම්කරුට අවවාද කිරීමේ ලිපිය නිකුත් කර ඇත්තේ ඔහුට එම වර්ෂයේ ඉතිරි නිවාඩු 63 1/2 ක් තිබියදී නම් ඉල්ලුම්කරුගේ පැමිණීම අසතුටුදායක තත්වයක පැවති බව නොපෙනේ.

*ප්‍රශ්නය :* තමා කියන ආකාරයට 2011 වර්ෂයට ඉල්ලුම්කරු නිවාඩු 63 1/2 ක් ඉතිරි කර තිබෙනවිට හා වැටුප් රහිත නිවාඩු නැතිව තමයි R3 කියන අවවාද ලිපිය නිකුත් කරලා තිබෙන්නේ නේද?

මේ හැර වග උත්තාරකාර පාර්ශ්වය විසින් R3 ලේඛනය ඉදිරිපත් කරමින් ඒ අනුව මෙම සිද්ධියට පෙර එනම් 2011 වසරෙහි ඉල්ලුම්කරු නිවාඩු ලබාගැනීම සම්බන්ධයෙන් අවවාදාත්මක ලිපි නිකුත්කර ඇති බව ප්‍රකාශ කර ඇත. එහිදී ඉල්ලුම්කරු ප්‍රකාශ කර ඇත්තේ එකී ලේඛනය සියලුදෙනාට යොමුකළ පොදු ලිපියක් බවත්, තමන් එකී වර්ෂය තුළ එකම වැටුප් රහිත නිවාඩුවක් ලබා නොමැති බවත් ය.

*ප්‍රශ්නය :* තමා කියන ආකාරයට 2011 වර්ෂයට ඉල්ලුම්කරු නිවාඩු 63 1/2 ක් ඉතිරි කර තිබෙනවිට හා වැටුප් රහිත නිවාඩු නැතිව තමයි R3 කියන අවවාද ලිපිය නිකුත් කරලා තිබෙන්නේ නේද?

*උත්තරය :* ඔව්. යනුවෙන් පිළිතුරු දීමෙන් එකී කරුණ තහවුරු වී ඇත. (2022.02.25 සාක්ෂි පිටු අංක 25)

තවද ''ඔව්'' යනුවෙන් උත්තර ලබාදී තවදුරටත් පැහැදිලි කර ඇත්තේ

උපශාලාධිපතිවරුන්ගේ ප්‍රශ්නය තමයි ඇඟිලි සලකුණු තබා පැමිණීම සටහන් කර කාර්යාලයෙන් රාජකාරියෙන් බැහැරව යාම වශයෙන් සාක්ෂිකරු පැවසුවද එය තහවුරු කිරීමට අවවාදාත්මක ලිපි තිබේදැයි හරස් ප්‍රශ්න විමසීමේදී ප්‍රශ්න කර ඇති අතර, එවැන්නක් නොමැති බව සාක්ෂිකරු ප්‍රකාශ කර ඇත. එසේ ප්‍රකාශ කළද ඉල්ලුම්කරු විසින් එලෙස රාජකාරිය පැහැර හැරියේද යන්න තහවුරු කිරීමට වග උත්තරකාර පාර්ශ්වය අපොහොසත්ව ඇත.

ii) මීළඟට සලකා බැලිය යුත්තේ ඉල්ලුම්කරු විසින් තම ඉහල නිලධාරියාට බැන තර්ජනය කළ බවට කරන ලද චෝදනාව කොතෙක් දුරට තහවුරු වී ඇත්ද යන්නයි. ඉල්ලුම්කරු විසින් එකී චෝදනාවද ප්‍රතික්ෂේප කර ඇති අතර එකී චෝදනාව පළි ගැනීමේ අරමුණ ඇතිව කරන ලද අසාධු චෝදනාවක් බව ප්‍රකාශ කර ඇත. මීට අමතරව ඉල්ලුම්කරු සිය දිවුරුම් ප්‍රකාශයෙහි ප්‍රකාශ කර ඇත්තේ එකී චෝදනා පත්‍රය ඉදිරිපත් කිරීමට පෙර පැවැත්වූ විනය පරීක්ෂණයේදී එවැනි බැන වැදීමක් සිදුකළ බවට කිසිදු ලිඛිත සාක්ෂියක් හෝ වෙනත් සාක්ෂි වග උත්තරකරු විසින් ඉදිරිපත් කර නොමැති බවත් විනය පරීක්ෂණයේදී පැමිණිලිකරුගේ ප්‍රකාශය මත පමණක් එල්බගෙන පූර්ව නිගමනයට පැමිණ මෙවැනි චෝදනාවක් ඉදිරිපත් කර ඇති බවයි.

තවද වග උත්තරකාර පාර්ශ්වයේ සාක්ෂිකරුගේ සාක්ෂිය ඉල්ලුම්කාර පාර්ශ්වයෙන් හරස් ප්‍රශ්නවලට භාජනය වී ඇති අතර R6 චෝදනා පත්‍රයේ පරිදි තමන්ට බැන තර්ජනය කරන අවස්ථාවේ එම ස්ථානයේ ලේඛකාධිකාරි සහ පීඨාධිපති යන අය සිටි බවත් තමන්ට දුරකථන මඟින් තර්ජනය කරන අවස්ථාවේ මයික්‍රෆෝනය විවෘත කර තිබූ බවත් සාක්ෂිකරු ප්‍රකාශ කර ඇත. කෙසේ වුවද තමන් එකී සාක්ෂි තම විනය පරීක්ෂණයට ඉදිරිපත් නොකළ බවද සාක්ෂිකරුගෙන් හරස් ප්‍රශ්න විමසීමේදී පිළිගෙන ඇත.

*ප්‍රශ්නය :* තමාට දෝෂාරෝපනය කළා කියන කතාව ඔප්පු කිරීමට තමාගේ දුරකථනයට මංජුල ප්‍රසාද් මහතාගෙන් දුරකථන ඇමතුමක් ලැබුණු බවට ඒ දුරකථන ආයතනයෙන් ලබාගත් තහවුරු කිරීමේ කිසිදු ලේඛනයක් මෙම විනය පරීක්ෂණයට හෝ ගරු අධිකරණයට ඉදිරිපත් කළාද?

*පිළිතුර :* නැහැ. යනුවෙන් ප්‍රකාශ කර ඇත. තවද,

*ප්‍රශ්නය :* මෙම ඉල්ලුම්කරු බැන්නා, මරණ තර්ජනය කළා කියලා ඔප්පු කිරීමට කිසිදු ලේඛනයක් එම විනය පරීක්ෂණයට හෝ මෙම ගරු අධිකරණයට තමා ඉදිරිපත් කළාද? යනුවෙන් විමසීමේ දී

*පිළිතුර :* නැහැ. එවැනි ලේඛනයක් මගෙන් ඉල්ලා සිටියේ නැහැ. යනුවෙන් ප්‍රකාශ කර ඇත. (2022.02.25 පිටු අංකඃ 9) මේ අනුව වග උත්තරකාර පාර්ශ්වයේ සාක්ෂිකරු මඟින් ඉල්ලුම්කරු තම ඉහල නිලධාරියාට බැන තර්ජනය කළ බවට ප්‍රකාශ වුවද, දුරකථන ඇමතුම් පිළිබඳ දුරකථන ආයතනයෙන් ලබාගත් කිසිදු ලේඛනයක් මඟින් හෝ එකී බැන වැදීම අසා සිටියේ යයි කියන ඉහල නිලධාරීන්ගේ සාක්ෂි මඟින් ඒ බව වැඩිදුරටත් තහවුරු කිරීමට වග උත්තරකාර පාර්ශ්වය අසමත්ව ඇත. මේ අනුව ඉල්ලුම්කරු තම ඉහල නිලධාරියාට බැන තර්ජනය කර ඇතැයි යන චෝදනාව විනය පරීක්ෂණයේදී හෝ නඩුවෙහි සාක්ෂි විමසීමේදී වැඩිබර සාක්ෂි මත තහවුරු වී නොමැති බව නිගමනය කරමි.

කෙසේ වුවද වග උත්තර පාර්ශ්වයේ සාක්ෂිකරු සිය සාක්ෂිදී ප්‍රකාශ කර ඇත්තේ ඉල්ලුම්කරු විසින් බැන තර්ජනය කිරීම සිදුකර ඇති බවත් ඒ පිළිබඳව තමන් R12 ලේඛනය මඟින් පොලීසියට පැමිණිලි කළ බවයි. තවද එකී පැමිණිල්ල පිළිබඳව පොලීසිය දෙපාර්ශ්වය කැඳවා විමර්ශනය කළ බවද, දෙපාර්ශ්වය අතර සමථයක් ඇතිවූ බවද, සාක්ෂිකරු පිළිගෙන ඇත.

වග උත්තරකාර පාර්ශ්වය විසින් ඉල්ලුම්කරුගෙන් හරස් ප්‍රශ්න විමසීමේදීද ඉල්ලුම්කරු විසින් W.W. අනුර මහතාට බැන තර්ජනය කිරීම සම්බන්ධයෙන් පොලීසියට පැමිණිල්ලක් කර ඇති බව පිළිගෙන ඇත. (2020.08.12 සාක්ෂි සටහන් පිටු අංක : 18)

මේ හැර 2020.09.16 දින ඉල්ලුම්කරුගෙන් හරස් ප්‍රශ්න විමසීමේදීද සහකාර ලේඛකාධිකාරි අනුර මහතා පොලීසියට පැමිණිල්ලක් කර තිබූ බව පිළිගෙන ඇති අතර ඒ සම්බන්ධයෙන් තමාගෙන් කට උත්තරගත් බවද ඉල්ලුම්කරු පිළිගෙන ඇත. කෙසේ වුවද මේ පිළිබඳව පොලීසිය මඟින් දෙපාර්ශ්වයටම අවවාද කර ඇති බවද වැඩිදුරටත් ප්‍රකාශ කර ඇත.

*ප්‍රශ්නය :* පොලිසියට දීපු කට උත්තරයෙන් පසු පොලිසිය ගත් ක්‍රියා මාර්ගය මොකක්ද?

*උත්තරය :* අපි දෙන්නම කැඳවලා අවවාද කරලා යන්න කීවා.

මේ අනුව දෙපාර්ශ්වයේම සාක්ෂි අනුව පෙනී යන්නේ දෙපාර්ශ්වය අතර යම් සිද්ධියක් සම්බන්ධයෙන් ආරාවුලක් ඇති වූ බව තහවුරු වේ. තවද ඒ පිළිබඳව පොලිසියට පැමිණිලි කළ බවද පොලිසිය ඒ පිළිබඳව මැදිහත්ව සමථයක් ඇති වූ බවද පෙනී යයි.

02. මෙම සිද්ධියට සම්බන්ධයෙන් වග උත්තරකාර ආයතනය විසින් සිදුකර ඇති විනය පරීක්ෂණය කොතෙක් දුරට සාධාරණද යන්න මීළඟට විමසා බැලිය යුතු කරුණ වේ.

ඉල්ලුම්කාර පාර්ශ්වය ප්‍රකාශ කර සිටින්නේ කිසිදු මූලික පරීක්ෂණයක් සිදු නොකොට වග උත්තරකරු විසින් විනය පරීක්ෂණයක් පවත්වා චෝදනා පත්‍රයක් නිකුත්කොට ඒ මත තමන්ට දැඩි දඬුවම් පමුණුවා ඇති බවයි. තවද මෙම විනය පරීක්ෂණට අදාල සිද්ධිය තහවුරු කිරීමට වග උත්තරකරු විසින් W.W. අනුර යන අයගේ වාචික සාක්ෂිය පමණක් උපයෝගී කරගෙන ඇති අතර, වෙනත් ලිඛිත හෝ වාචික සාක්ෂි උපයෝගීකර නොගැනීම හේතුවෙන් එකී විනය පරීක්ෂණය මත පැනවූ විනය නියෝගයද අසාධාරණ බවට ප්‍රකාශ කර ඇත. මෙකී සිද්ධිය සම්බන්ධයෙන් වග උත්තරකාර පාර්ශ්වය විසින් සිද්ධියට මුහුණ දුන්නේයැයි කියනු ලබන W.W. අනුර යන සාක්ෂිකරු පමණක් සාක්ෂි සඳහා කැඳවා ඇත. කෙසේ වුවද එකී සිද්ධිය වන බැන තර්ජනය කරන අවස්ථාවේ එම ස්ථානයේ සිටියේ යයි වග උත්තරකාර පාර්ශ්වයේ සාක්ෂිකරු විසින්ම කියනු ලබන තම ඉහල නිලධාරීන් හෝ සාක්ෂියට කැඳවා නොමැති බව සාක්ෂි විමසීමේදී පෙනී යයි. මේ හැර දුරකථනය මගින් තර්ජනය එල්ලවූ බව වග උත්තරකාර පාර්ශ්වයේ සාක්ෂිකරු විසින් ප්‍රකාශ කර සිටියද, එම තොරතුරු සාක්ෂියක් ලෙස විනය පරීක්ෂණයට හෝ බේරුම්කරණය වෙත යොමුකර නොමැති බව වග උත්තරකරුගේ සාක්ෂියේදී වග උත්තරකාර පාර්ශ්වය විසින්ම ප්‍රකාශ කර ඇත. මේ අනුව ඉල්ලුම්කරු සම්බන්ධයෙන් පැවැත්වූ විනය පරීක්ෂණයේදී සිද්ධියට අදාල සියලු සාක්ෂි කැඳවීමක් නොකොට වග උත්තරකාර පාර්ශ්වයේ සිද්ධියට මුහුණදුන් පුද්ගලයාගේ වාචික සාක්ෂිය පමණක් කැඳවීමෙන් විනය පරීක්ෂණය මගින් විනිවිද භාවයකින් යුතුව කරුණු අනාවරණය වී නොමැති බව නිගමනය කරමි.

03. විනය නියෝගය මත ඉල්ලුම්කරුට ලබාදී ඇති දඬුවම් කොතෙක් දුරට සාධාරණද යන්න මීළඟට සලකා බැලිය යුතු කරුණ වේ.

R11 නියෝගය අනුව ඉල්ලුම්කරුට බරපතල දඬුවම් දී ඇති බවත් ඒ අනුව ඉල්ලුම්කරුගේ උපයාගෙන ඇති වැටුප් වර්ධක සියල්ල විලම්බනය කර ඇති බවත් සාක්ෂිකරුගෙන් සාක්ෂි විමසීමේදී පිළිගෙන ඇත.

*ප්‍රශ්නය :* R11 ලේඛනයේ සඳහන් වෙනවා ඉල්ලුම්කරුට ලබාදී ඇති බරපතල දඬුවමක් ලෙස ඉල්ලුම්කරු උපයාගෙන සිටි වැටුප් වර්ධක සියල්ලම විලම්බනය කරනවා කියලා නේද?

*පිළිතුර :* ඔව්.

තවද එම තීරණය ගෙන ඇත්තේ ආයතන සංග්‍රහයේ 4:1:2 කොටසට අනුව බවද ඉල්ලුම්කරු ප්‍රකාශ කර ඇත. කෙසේ වුවද එකී ලේඛනයට අනුව උපයාගත් වැටුප් වර්ධක විලම්භනය කිරීමේ හැකියාව තිබේද යන්න විමසීමේදී එය තමා නොදන්නා බවද ඉල්ලුම්කරු ප්‍රකාශ කර ඇත.

*ප්‍රශ්නය:* 4:1:2 ඡේදය අනුව ආයතන සංග්‍රහය තහවුරු කිරීමට සේවකයෙක් උපයාගෙන තිබෙන වැටුප් වර්ධක සියල්ලම අහෝසි කරන්න පුළුවන් කියලා කිසියම් සෘජු චක්‍ර ලේඛනයක් තිබෙනවාද?

*උත්තරය:* මම දන්නේ නැහැ. යනුවෙන් ප්‍රකාශ කර ඇත.

තවද මෙම විනය දඬුවම් නියම කිරීම සම්බන්ධයෙන් සාක්ෂි දීමේ හැකියාවක් තමන්ට නොමැති බවද සාක්ෂිකරු වැඩි දුරටත් ප්‍රකාශ කර ඇත.මේ අනුව ඉල්ලුම්කරු උපයාගෙන ඇති වැටුප් වර්ධක සියල්ල විලම්භනය කිරීමට යම් නීතිමය ප්‍රතිපාදනයක් තිබේද යන්න වග උත්තරකාර පාර්ශ්වය විසින් තහවුරු කර නොමැත. කෙසේ වුවද උපයාගත් වැටුප් වර්ධක විලම්බනය කිරීමක් සාමාන්‍ය නීතිය යටතේ සිදු නොකරන අතර අතීතයට බලපාන ලෙස නීති ක්‍රියාත්මක කිරීමේ ප්‍රතිපාදන නොමැත. මේ අනුව ඉල්ලුම්කරු විසින් උපයාගත් වැටුප් වර්ධක අහිමි කිරීමට වග උත්තරකාර පාර්ශ්වයට නීතිමය ප්‍රතිපාදන නොමැති බව නිගමනය කරමි.

ප්‍රදානය

ඉහත සඳහන් කළ පරිදි දෙපාර්ශ්වයේම ලිඛිත ප්‍රකාශන වාචික සාක්ෂි සහ ලිඛිත දේශනා ආදී තොරතුරු පරීක්ෂාකර පහත පරිදි මෙම නඩුවේ ප්‍රදානය ඉදිරිපත් කරමි.
ඉහතින්ද සඳහන් කළ පරිදි 2013.03.14 දිනැති ඉල්ලුම්කරුට විරුද්ධව ඇති චෝදනාවන් වන

I. ඉල්ලුම්කරු ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලයේ අධ්‍යයන හා ශිෂ්‍ය සේවා අංශයේ II ශ්‍රේණියේ පූර්න කාලීන නේවාසිකාගාර උපපාලකවරයෙකු ලෙස සේවය කරමින් සිටියදී 2013.06.20 දින අවසරයකින් තොරව සේවා ස්ථානයෙන්

බැහැරව සිටීම යන චෝදනාව ලිඛිත හෝ වාචික සාක්ෂි මත සාධාරණ සැකයෙන් තොරව ඔප්පු වී නොමැති බව නිගමනය කරමි. විශේෂයෙන් එදින ඉල්ලුම්කරු ඇඟිලි සලකුණු තබා සේවයට පැමිණීම සිදුකර නොතිබීම සහ ඔහු එදින විදුලි පණිවුඩයක් මගින් නිවාඩු ලබාගෙන එය අනුමත කරවාගෙන තිබීම යන කරුණු ඉල්ලුම්කාර පාර්ශ්වය මගින් සිය සාක්ෂි මගින් සනාථ කර ඇත. තවද, එකී නිවාඩු අනුමත කර ඇත්තේ ද වග උත්තරකාර පාර්ශ්වය විසිනි. එමෙන්ම එකී නිවාඩු අනුමත වී ඇති බව සහ ලේඛනගතව ඇති බව ද වගඋත්තරකාර පාර්ශ්වයේ සාක්ෂි මත තහවුරු වී ඇත. මේ අනුව ආයතනයේ පැමිණීම සටහන් නොකොට නිවාඩු සඳහා ද අනුමැතිය ලබාගත් අවස්ථාවක සේවයෙන් බැහැරව සිටියදී අවසරයකින් තොරව සේවා ස්ථානයෙන් බැහැරව සිටි බවට කරන චෝදනාව කිසිදු පදනමකින් තොරව කරන ලද චෝදනාවක් බව නිගමනය කරමි.

II. තවද එසේ සේවා ස්ථානයෙන් බැහැරව සිටියදී තම සහකාර ලේඛකාධිකාරි W.W. අනුර මහතාට බැන තර්ජනය කිරීම යන චෝදනාවද වගඋත්තරකාර පාර්ශ්වය විසින් සාධාරණ සැකයකින් තොරව ඔප්පු කර නොමැත. විනය පරීක්ෂණයේදී එකී චෝදනාව සම්බන්ධයෙන් වන W.W. අනුර මහතාගේ සහතික ලබාගෙන ඇත. කෙසේ වුවද එකී බැන තර්ජනය කිරීම දුරකථනයෙන් සිදුකර ඇති බවට වාචික සාක්ෂි ඉදිරිපත් කර තිබුණ ද එය තහවුරු කිරීමට දුරකථන සාකච්ඡාවට අදාලව අදාල ආයතනය මගින් ලබාගත් සාක්ෂි ඉදිරිපත් කළ හැකිව තිබුනද වගඋත්තරකරු විසින් සාධාරණ සැකයකින් තොරව එකී කරුණු ඔප්පු කර නැත. තව ද එකී බැන තර්ජනය කිරීම සිදුවන අවස්ථාවේ තමා අසල සිටි ඉහල නිලධාරීන්ට එකී තර්ජනය අසා සිටීමට සලසා සිටි බවට වගඋත්තරකාර පාර්ශ්වයේ සාක්ෂිකරු කරුණු ඉදිරිපත් කලද එකී සාක්ෂිකරුවන් හෝ අදාල විනය පරීක්ෂණයට හෝ අධිකරණයට කැඳවා එකී සාක්ෂි තහවුරු කර නොමැත. එසේ සාක්ෂි නොකැඳවූ බව වග උත්තරකාර පාර්ශවයේ සාක්ෂිකරුගෙන් හරස් ප්‍රශ්න විමසීමේදී විමසා ඇති අතර එම සාක්ෂි තමන් විසින් කැඳවා නොමැති බව සාක්ෂිකරු පිළිගෙන ඇත. මේ අනුව චෝදනා පත්‍රයේ i හා ii වශයෙන් සඳහන් මූලික චෝදනාවන් සාක්ෂි මත සාධාරණ සැකයෙන් තොරව තහවුරු වී නොමැති බව නිගමනය කරයි. ඒ අනුව ඊට ආනුෂංගික චෝදනාවන් වන 2013.08.14 දිනැති චෝදනා පත්‍රයේ සඳහන් චෝදනාවන්ද ප්‍රතික්ෂේප වන බව නිගමනය කරමි. මේ අනුව එකී චෝදනා පත්‍රයේ සඳහන් චෝදනාවන්ගෙන් පැමිණිලිකරු නිදහස් වන බව නිගමනය කරමින් ඉහත කී පරිදි සාධාරණ සැකයකින් තොරව තහවුරු නොවූ චෝදනා මත වගඋත්තරකාර පාර්ශ්වය විසින් 2014.02.19 දිනැතිව ආයතන සංග්‍රහයේ xxii වන පරිච්ඡේදයේ 4:1:2 උපඡේදය ප්‍රකාරව දඬුවම් පමුණුවා ඇත. ඒ අනුව ඉල්ලුම්කරුගේ වැටුප් පරිමාණයෙහි ආරම්භක තනතුරේ පිහිටුවා ඇති අතර එතෙක් ඉල්ලුම්කරු විසින් උපයාගත් වැටුප් වර්ධකද නතර කර ඇත.

ඉහත කී පරිදි ඉල්ලුම්කරුට නගා ඇති චෝදනාවන් සාධාරණ සැකයකින් තොරව තහවුරු වී නොමැති බැවින් ඉල්ලුම්කරුට ආයතන සංග්‍රහයේ දැක්වෙන පරිදි බරපතල දඬුවම් නියම කිරීම කිසිසේත් සාධාරණ නොවන බව තීරණය කරන අතර අතීතයට බලපාන ලෙස උපයාගත් වැටුප් වර්ධක සියල්ල අහිමි කිරීම යුක්ති සහගත සහ සාධාරණ නොවන බවද තීරණය කරමි.

1. මේ අනුව 2014.02.19 දිනැතිව ඉල්ලුම්කරුට විරුද්ධව පනවා ඇති විනය නියෝගය බල රහිත කර විලම්භනය කර ඇති වැටුප් වර්ධක නැවත හිඟ වැටුප් සමඟ ලබාදෙමින් 2014.02.19 දින සිට ක්‍රියාත්මක වන පරිදි තනතුරට හිමි වැටුප් පරිමාණයේ පිහිටුවමින් ඒ අනුව ඉල්ලුම්කරු විසින් සිය සාක්ෂියේදී "X" ලේඛනයෙන් ඉල්ලා ඇති පරිදි ඉල්ලුම්කරුට ලැබීමට ඇති හිඟ වැටුප් වන රුපියල් 560,878.50 (රුපියල් පන්ලක්ෂ හැට දහස් අටසිය හැත්ත අටයි සත පනහක මුදල) ඉල්ලුම්කරුට ලබාගත හැකි පරිදි කහවත්ත දිස්ත්‍රික් කම්කරු කාර්යාලයේ තැන්පත් කරන මෙන් වග උත්තරකරුට නියෝග කරමි.

2. තවද එකී හිඟ වැටුප් සඳහා අදාල ව්‍යවස්ථාපිත දීමනා සඳහා හිමිකම් ඇති බව තීරණය කරමි.

3. කෙසේ වුවද මෙම නඩුවට අදාල සිද්ධිය සම්බන්ධයෙන් වග උත්තරකාර පාර්ශ්වය විසින් පොලිසිය වෙත කරන ලද පැමිණිල්ල විභාගයට ගැනීමේදී දෙපාර්ශ්වය විසින් පැමිණිල්ල සමථයට පත්කරගෙන ඇති බව සාක්ෂි මගින් තහවුරු වී ඇත.

ඒ අනුව මෙම නඩුවට අදාලව දෙපාර්ශ්වය අතර යම් ආරාවුලක් ඇතිව තිබූ බව තහවුරු වේ. ඒ අනුව විනය නියෝගය ප්‍රකාරව පනවා ඇති දඬුවම් අතරින් මෙවැනි වැරදි යලි සිදුකළහොත් සහ එකී වැරදි සාධාරණ සැකයෙන් තොරව සිදුවුවහොත් ඉල්ලුම්කරුට විරුද්ධව දැඩි විනයානුකූල පියවර ගැනීමට ඉඩ ඇති බව වැඩිදුරටත් සඳහන් කරමි.

මෙය සාධාරණ හා යුක්ති සහගත ප්‍රදානයක් බව සහතික කරමි.

එච්.එම්. අනුලාවතී,
බේරුම්කරු.
2022 නොවැම්බර් මස 29 වැනි දින,

EOG 12-0317

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.